සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2024
## 13 ශ්‍රේණිය - අවසාන වාර පරීක්ෂණය

ආර්ථික විද්‍යාව - I
Economics - I

21 S I

පැය දෙකයි
Two Hours

උපදෙස් :
- **සියලු ම** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**

1. පහත පිළිතුරු අතරින් සාර්ව ආර්ථික විචල්‍යයක් සහ සාර්ව ආර්ථික ප්‍රශ්නයක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර හඳුනාගන්න.
(1) සේවා වියුක්තිය - නිෂ්පාදන පිරිවැය
(2) සහල් මිල - උද්ධමනය
(3) විනිමය අනුපාතය - පොහොර මිල ඉහළ යාම
(4) මිල මට්ටම - ආර්ථික පසු බැසීම
(5) ගෙවුම් ශේෂය - ඛනිජ තෙල් ආනයනය ඉහළ යාම

2. අවස්ථික පිරිවැයකින් තොරව භාණ්ඩයක් ලෙසත්, නිෂ්පාදන සාධකයක් ලෙසත් භාවිත කළ හැක්කේ කුමක්ද?
(1) පිරිසිදු ජලය
(2) නුපුහුණු ශ්‍රමය
(3) ඉඩම්
(4) වායුගෝලීය ඔක්සිජන්
(5) වනාන්තර

3. ආර්ථිකයක නිෂ්පාදන හැකියා වක්‍රය සරල රේඛීය නම් එයින් කියැවෙන්නේ,
(1) අවස්ථික පිරිවැය ශුන්‍ය වන බවයි.
(2) සම්පත් එකිනෙකට ආදේශ කළ නොහැකි වන බවයි.
(3) පූර්ණ සේවා නියුක්තිය ලඟා කර ගත නොහැකි බවයි.
(4) සේවා වියුක්ත සම්පත් විශාල ප්‍රමාණයක් පවතින බවයි.
(5) නිෂ්පාදන සම්පත් සමජාතීය වන බවයි.

4. හිඟ සම්පත් විකල්ප අරමුණු අතර බෙදී යාම සමාජ වරණය අනුව සිදුවන විට,
(1) පාරිභෝගික ස්වාධිපත්‍යයක් පවතී.
(2) රජය ආර්ථික කටයුතුවලින් සම්පූර්ණයෙන්ම ඉවත් වේ.
(3) මධ්‍ය සැලසුම්කරණය සමඟ මිල යාන්ත්‍රණයද ක්‍රියාත්මක වේ.
(4) ආර්ථිකය සතු සියලුම දේපළ රාජ්‍ය අංශය සතුවේ.
(5) සියලුම ආර්ථික පද්ධති මිශ්‍ර ආර්ථික පද්ධති බවට පත්වේ.

5. සහල් මිලට සාපේක්ෂව පාන්වල හරස් මිල ඉල්ලුම් නම්‍යතාව 0.8ක් නම් එයට ගැලපෙන ප්‍රකාශය තෝරන්න.
(1) පාන් වල මිල රුපියල් 1000 සිට 2000 දක්වා ඉහළ යන විට සහල් ඉල්ලුම ඒකක 50 සිට 90 දක්වා ඉහළ යයි.
(2) සහල් මිල රු.200 සිට 250 දක්වා ඉහළ යන විට පාන් ඉල්ලුම 50 සිට 60 දක්වා ඉහළ යයි.
(3) සහල් මිල රුපියල් 2000 සිට 3000 දක්වා ඉහළ යන විට සහල් ඉල්ලුම ඒකක 200 සිට 300 දක්වා ඉහළ යයි.
(4) සහල් මිල රු.400 සිට 550 දක්වා ඉහළ යන විට පාන් ඉල්ලුම 200 සිට 150 දක්වා අඩු වේ.
(5) පාන් මිල රු.120 සිට 150 දක්වා ඉහළ යන විට සහල් ඉල්ලුම ඒකක 60 සිට 45 දක්වා අඩුවේ.

6. වෙළඳපොළක සැපයුම්කරුවන්ගේ මුළු අයභාරය මුළු නිෂ්පාදක අතිරික්තයට සමාන වේ නම්,
(1) සැපයුම් වක්‍රය පූර්ණ නම්‍ය තිරස් රේඛාවකි.
(2) ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහළ බසින සරල රේඛාවකි.
(3) සැපයුම් වක්‍රය සිරස් අක්ෂයට සමාන්තර පූර්ණ අනම්‍යතාවකින් යුක්තවේ.
(4) මුළු පාරිභෝගික අතිරික්තය මුළු නිෂ්පාදක අතිරික්තයට සමාන වේ.
(5) මුළු නිෂ්පාදක අතිරික්තය මුළු විචල්‍ය පිරිවැයට සමාන වේ.

7. පහත දැක්වෙන භාණ්ඩ පහ අතුරින් ගිෆන් භාණ්ඩයක් නොවන බාල භාණ්ඩය කුමක්ද?
(1) A (2) B (3) C (4) D (5) E

| | A | B | C | D | E |
|---|---|---|---|---|---|
| මිල ඉල්ලුම් නම්‍යතාව | 0.2 | -0.5 | -1.2 | 0.8 | 0 |
| ආදායම් ඉල්ලුම් නම්‍යතාව | 0.2 | -0.5 | 2.0 | -0.8 | 0 |


8. සාමාන්‍ය භාණ්ඩයක මිල ඉහළ යන විට,
(1) පාරිභෝගිකයින්ගේ මූර්ත ආදායම හා භාණ්ඩයේ සාපේක්ෂ මිල ඉහළ යයි.
(2) පාරිභෝගිකයින්ගේ නාමික ආදායම හා භාණ්ඩයේ සාපේක්ෂ මිල ඉහළ යයි.
(3) පාරිභෝගිකයින්ගේ මූර්ත ආදායම පහළ වැටී භාණ්ඩයේ සාපේක්ෂ මිල ඉහළ යයි.
(4) පාරිභෝගිකයින්ගේ මූර්ත ආදායම, භාණ්ඩයේ නිරපේක්ෂ මිල සහ සාපේක්ෂ මිල ඉහළ යයි.
(5) ඉල්ලුම් ප්‍රමාණයේ පහළ වැටීම මුළුමනින්ම මූර්තආදායමේ පහළ වැටීම මත රඳා පවතී.

9. පරිභෝජනයේ ආසන්න ආදේශක බහුල භාණ්ඩයක ඉල්ලුම නොවෙනස්ව පවතිද්දී සැපයුම වැඩි වුවහොත් පහත සඳහන් දෑ අතුරින් ඉහළ යන්නේ කුමක්ද?
(1) භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාව සහ මුළු පාරිභෝගික පැහැදම
(2) සමතුලිත මිල සහ නිෂ්පාදකයින්ගේ මුළු අය භාරය
(3) ඉල්ලුම් ප්‍රමාණය හා නිෂ්පාදකයින්ගේ මුළු අය භාරය
(4) භාණ්ඩයේ සැපයුම් නම්‍යතාව සහ ඉල්ලුම් වක්‍රයේ බෑවුම
(5) භාණ්ඩයේ අවම සැපයුම් මිල සහ උපරිම ඉල්ලුම් ප්‍රමාණය

10. තරගකාරී වෙළඳපොළක අනිකුත් සාධක ස්ථාවරව පවතින විට සැපයුම අඩු වුවහොත් වෙළඳපොළේ දක්නට ලැබෙන ආරම්භක වෙනස වන්නේ,
(1) අධි ඉල්ලුමක් හට ගැනීමය. (2) වෙළඳපළේ මිල ඉහළ යාමය.
(3) සමතුලිත මිල ඉහළ යාමය. (4) ඉල්ලුම් ප්‍රමාණය අඩුවීමය.
(5) සැපයුම් ප්‍රමාණය වැඩිවීමය.


11. තරගකාරී වෙළඳපොළක අලවිවන කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා සඵල උපරිම මිල පාලනයක ප්‍රතිඵලයක් ලෙස ඉහළ යන්නේ,
(1) වෙළඳපොළ ඉල්ලුමය. (2) වෙළඳපොළ සැපයුමයය. (3)මුළු නිෂ්පාදක අතිරික්තයය
(4) මුළු අය භාරය ය. (5) ඉල්ලුම් ප්‍රමාණයය.

12. පහත රූපයේ දැක්වෙන වෙළඳපොළෙහි රු.12 ක නිශ්චිත සහනාධාරයක් සපයා ඇත රජය එම සහනාධාරය ඉවත් කිරීමට තීරණය කළහොත් සමාජ සුභසාධනයේ ඉහළ යාම කොපමණද?




(1) රු.24
(2) රු.48
(3) රු.96
(4) රු.120
(5) රු.148

13. පහත රූපයේ D මගින් කෘෂි භාණ්ඩයක ඉල්ලුම දැක්වෙන අතර මූලික සැපයුම S0 මගින් දැක්වේ ඉහළ අස්වැන්නක් ලැබීම නිසා සැපයුම S1 දක්වා වෙනස් වුවහොත් ගොවීන්ගේ අයභාරය නොවෙනස්ව තබා ගැනීමට ඉල්ලුම් වක්‍රය විතැන් කළ යුතු ප්‍රමාණය,





(1) ටොන් 1000 කි. (2) ටොන් 2000 කි. (3) ටොන් 3000 කි.
(4) ටොන් 4000 කි. (5) ටොන් 5000 කි.

14. තරගකාරී වෙළඳපොළක Qd=100-P ,Qs= -20+2P ද වේ යැයි සිතන්න. රජය සැපයුම්කරුවන්ගෙන් රුපියල් 30ක නිශ්චිත බද්දක් අය කිරීම ට තීරණය කළහොත් බද්දෙන් පසු,

| | සමතුලිත මිල | මුළු පාරිභෝගික අතිරික්තය | මුළු නිෂ්පාදන අතිරික්තය | අයි බදු බර |
|---|---|---|---|---|
| (1) | 60 | 800 | 600 | 150 |
| (2) | 50 | 400 | 400 | 300 |
| (3) | 40 | 600 | 500 | 150 |
| (4) | 30 | 800 | 400 | 800 |
| (5) | 60 | 800 | 400 | 300 |

15. පහත රූප සටහනේ දක්වා ඇත්තේ සහල් වෙළඳපොළක ඉල්ලුම සහ සැපයුමයි. රජය රුපියල් 150 ක් ලෙස අවම මිලක් හඳුන්වා දීමට තීරණය කළොත් ඇති වන ප්‍රතිඵලය වන්නේ කුමක්ද?




(1) $Q_0$ ප්‍රමාණය වෙළඳපලේ අලෙවිවීම.
(2) අලෙවිවන ප්‍රමාණය $Q_0$ සිට $Q_2$ දක්වා ඉහළ යාම.
(3) රජයට $Q_0$ - $Q_1$ ප්‍රමාණය සැපයීමට සිදුවීම.
(4) $Q_1$ ප්‍රමාණය වෙළෙඳපොළේ අලෙවි වීම.
(5) $Q_0$ -$Q_1$ ප්‍රමාණයක අයි සැපයුමක් නිර්මාණය වීම.

16. හීන වෙන ආන්තික ඵලදා නීතියට අනුව කෙටි කාලයේදී විචල්‍ය සාධකය සේවා නියුක්ත කරමින් නිෂ්පාදනය ඉහළ දමන විට මුළුඵලදා වක්‍රයේ බෑවුම පහළ වැටෙන නමුත් ධන අගයක් ගනු ලබන පරාසයේදී,

(1) සාමාන්‍ය ඵලදාව පහළ වැටෙන නමුත් එය සෑම විටම ධන අගයක් ගනී.
(2) යම් අවස්ථාවකදී ආන්තික ඵලදාව සාමාන්‍ය ඵලදාවට සමාන වේ.
(3) ආන්තික ඵලදාව සැමවිටම සාමාන්‍ය ඵලදාව ඉක්මවා යයි.
(4) සාමාන්‍ය ඵලදාව සැමවිටම ආන්තික ඵලදාව ඉක්මවා යයි.
(5) ආන්තික ඵලදාව ඉහළ ගොස් පසුව පහළ වැටෙයි.

17. දිගු කාලයේදී ව්‍යාපාරික ආයතනයක් නිෂ්පාදනයේ වැඩෙන පරිමාණානුකූල ඵල ලබන්නේ නම් නිෂ්පාදන පිරිවැය තුළ,

(1) විචල්‍ය සාධකය භාවිත කරන සෑම විටම ආන්තික ඵල හීන වීම නිසා ආන්තික පිරිවැය ඉහළ යයි.
(2) දිගු කාලීන සාමාන්‍ය පිරිවැය ඉහළ ගොස් පසුව පහළ වැටෙයි.
(3) තාක්ෂණික පිරිමැසුම් හේතුකොට ගෙන සාමාන්‍ය පිරිවැය පහළ වැටෙයි.
(4) පරිමාණානුකූල නොපිරිමැසුම් ලබමින් සාමාන්‍ය පිරිවැය ඉහළ නගී.
(5) මුළු ස්ථාවර පිරිවැය නොවෙනස්ව පැවතුනද මුළු විචල්‍ය පිරිවැය ඉහළ යයි.

18. පූර්ණ තරගකාරී වෙළෙඳපොළක කටයුතු කරන එක් ආයතනයක් තම නිමැවුම් මට්ටම ප්‍රසාරණය කිරීමට තීරණය කළහොත්,

(1) ආන්තික ආයභාරය සහ සාමාන්‍ය අයභාරය යන දෙකම පහළ වැටේ.
(2) මුළු අයභාරය මුලදී ඉහළ ගොස් පසුව පහළ වැටේ.
(3) අඛණ්ඩවම නිෂ්ප්‍රාමාණික ලාභය ඉහළ යයි.
(4) නිමැවුම් මට්ටම වෙනස් කරන ප්‍රතිශතයට වඩා අඩු ප්‍රතිශතයකින් මුළු අයභාරය ඉහළ යයි.
(5) නිමැවුම් මට්ටම වෙනස් කරන ප්‍රතිශතයට සමාන ප්‍රතිශතයකින් මුළු අයභාරය ඉහළ යයි.

19. ඒකාධිකාරී වෙළඳපොළ ව්‍යුහය සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් නිවැරදි වනුයේ කුමක්ද?

(1) ආයතනය මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය සිරස් අක්ෂයට සමාන්තර පූර්ණ අනම්‍ය ඉල්ලුම් වක්‍රයකි.
(2) අනෙකුත් ආයතනවලින් පැමිණෙන තර්ජනවලින් ආරක්ෂා වීමට ඒකාධිකාරියා නොනවත්වාම නව්‍යතා සම්පාදනය කරයි.
(3) වෙළඳපොළේ එකම සැපයුම්කරුවා බැවින් මිල සහ නිමැවුම යන දෙකම තීරණය කිරීමට ආයතනයට හැකියාව තිබේ.
(4) ආයතනය නිමැවුම ඉහළ දමන විට එම ප්‍රතිශතයෙන්ම මුළු අයභාරයද ඉහළ යයි.
(5) ආයතනය කෙටි කාලයේදී නිෂ්ප්‍රාමාණික ලාභ ඉපැයුවද ප්‍රවේශයට ඇති බාධක නිසා එම ලාභය දිගු කාලයේදීද රඳවා ගනී.

20. මූලික මිල යටතේ සමස්ත දළ එකතු කළ වටිනාකම දළජාතික ආදායම බවට පත්කිරීම සඳහා එකතු කළ යුතු දෑ නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ශුද්ධ අපනයන, විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම සහ විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම
(2) නිෂ්පාදිතය මත ශුද්ධ බදු සහ විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම
(3) නිෂ්පාදනය මත වෙනත් ශුද්ධ බදු, නිෂ්පාදිතය මත ශුද්ධ බදු සහ විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම
(4) නිෂ්පාදිතය මත ශුද්ධ බදු සහ දළ දේශීය ඉතුරුම්
(5) විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම සහ විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම

21. අදාළ වර්ෂය තුළ ව්‍යාපාරික ආයතනවල අලෙවි නොවූ භාණ්ඩ තොගවල වටිනාකම,

(1) එම වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් කරනු නොලබයි.
(2) ඊළඟ වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයට පමණක් ඇතුළත් කරනු ලබයි.
(3) ආයෝජනයක් ලෙස සලකා එම වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් කරනු ලබයි.
(4) අතරමැදි පරිභෝජන භාණ්ඩ වශයෙන් තීරණය කොට ජාතික ගිණුම්වලින් බැහැර කරනු ලබයි.
(5) කල් ඉකුත් වූ නිෂ්පාදිත බවට උපකල්පනය කර දළ දේශීය නිෂ්පාදිතයෙන් බැහැර කරනු ලබයි.

22. 2023 ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික විවරණයට අනුව ශ්‍රී ලංකාවේ දළ ජාතික ආදායම සහ ඒක පුද්ගල දළ ජාතික ආදායම නිවැරදිව සඳහන් කර ඇති පිළිතුර තෝරන්න.

| | දළ ජාතික ආදායම (US $ බිලියන) | ඒක පුද්ගල දළ ජාතික ආදායම (US $) |
|---|---|---|
| (1) | 82.1 | 3747 |
| (2) | 86.6 | 3910 |
| (3) | 74.9 | 3378 |
| (4) | 81.7 | 3706 |
| (5) | 84.4 | 3830 |

23. සාර්ව ආර්ථිකයක වැය කළ හැකි දළ ජාතික ආදායම් මට්ටම රු. බිලියන 10000 දී සමාහාර පරිභෝජනය රු. බිලියන 12000ක් වන අතර වැය කළ හැකි ආදායම් මට්ටම රු. බිලියන 20000 දී සමාහාර පරිභෝජනය රු. බිලියන 17000 ක් නම් ගුණකයන්වල නිවැරදි අගයන් පෙන්වන පිළිතුර හඳුනාගන්න.


| | වියදම් ගුණකය | ස්ථාවර බදු ගුණකය | සංක්‍රාම ගුණකය | සමතුලිත අයවැය ගුණකය |
|---|---|---|---|---|
| (1) | 4.0 | -3.0 | 3.0 | 1.0 |
| (2) | 3.0 | -2.0 | 2.0 | 1.1 |
| (3) | 2.0 | -1.0 | 1.0 | 1.0 |
| (4) | 5.0 | -4.0 | 4.0 | 2.0 |
| (5) | 10.0 | -9.0 | 9.0 | 1.1 |

24. ආර්ථිකයක සමාහාර කාන්දුවීම් ශ්‍රිතය : W = රු. බි. 1000 + 0.4Y නම් මෙම ආර්ථිකයේ සමාහාර ස්වාධීන ආයෝජනය රු. බිලියන 400කින් වැඩි වුවහොත් සමාහාර පරිභෝජනයේ ඉහළ යාම රු. බිලියන,

(1) 500කි. (2) 600කි. (3) 800කි. (4) 1000කි. (5) 1200කි.

25. පහත දැක්වෙන්නේ යම් ආර්ථිකයක සාර්ව ආර්ථික සමතුලිතයයි. YF මගින් දැක්වෙන්නේ පූර්ණ සේවා නියුක්ති ජාතික ආදායම් මට්ටමය. දී ඇති තොරතුරුවලට අනුව ආර්ථිකය මුහුණ දී ඇති අවධමන පරතරය කොපමණද? (රු. බිලියන)

(1) 50කි.
(2) 100කි.
(3) 150කි.
(4) 200කි.
(5) 250කි.




26. ආර්ථිකයක මූර්ත දළ ජාතික ආදායම ඉහළ යාමේ ප්‍රතිඵලයක් හැටියට සිදු නොවේ යැයි සැලකිය හැකි ප්‍රතිවිපාකය කුමක්ද?
(1) මුදල් සැපයුම ඉහළ යාම (2) මුදල් ඉල්ලුම ඉහළ යාම
(3) නාමික දළ ජාතික ආදායම ඉහළ යාම (4) මිල මට්ටම ඉහළ යාම
(5) ඉතුරුම් ඉහළ යාම

27. යම් නිශ්චිත කාල ලක්ෂ්‍යයකදී රටක මහජනතාව සතුව පවතින මුළු මුදල් තොගය මුදල් සැපයුම ලෙස අර්ථ දැක්වේ.ශ්‍රී ලංකාවේ $M_4$ මුදල් සමස්තය ගණනය කිරීමේදී පහත සඳහන් ආයතන අතුරින් මහජනතාවට ඇතුළත් වන්නේ කවරක්ද?
(1) ශ්‍රී ලංකා මහ බැංකුව (2) බලපත්‍ර ලාභී වාණිජ බැංකු
(3) බලපත්‍ර ලාභී විශේෂිත බැංකු (4) බලපත්‍රලාභී මූල්‍ය සමාගම්
(5) සේවක අර්ථසාධක අරමුදල

28. වාණිජ බැංකු පද්ධතියකට මහජනතාව වෙත සැපයිය හැකි උපරිම ණය ප්‍රමාණය L නම්,
(1) L = සංචිතය × තැන්පතු ගුණකය (2) L = අධිසංචිත × මුදල් ගුණකය
(3) L = ආරම්භක තැන්පතුව × තැන්පතු ගුණකය (4) L = තැන්පතු ÷ සංචිතය
(5) L = අධිසංචිත × තැන්පතු ගුණකය

29. සංකෝචනාත්මක මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව වාණිජ බැංකු වෙතින් මහජනතාවට සපයනු ලබන ණය ප්‍රමාණය සීමා කිරීමට අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තියක් වනුයේ පහත සඳහන් දෑ අතුරින් කුමක්ද?
(1) වාණිජ බැංකු සමග තරගකාරීව කටයුතු කර භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම
(2) ප්‍රතිවිකුණුම් වෙළඳපොළට මැදිහත් වී වාණිජ බැංකු වෙතින් භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම
(3) නිත්‍ය පොලී අනුපාත කොරිඩෝවේ ඉහළ සීමාව තවත් ඉහළ දැමීම
(4) වාණිජ බැංකු සපයන සමහර ණය වර්ග සඳහා පරිණත කාල දීර්ඝ කිරීම
(5) අඛණ්ඩවම විදේශ විනිමය වෙළඳපොළට මැදිහත් වී විදේශ විනිමය මිලට ගැනීම


30. පහත රූප සටහනෙන් විස්තර කරන සංසිද්ධිය සහ එයට හේතුව නිවැරදිව දැක්වෙන පිළිතුර හඳුනාගන්න.




| | සංසිද්ධිය | හේතුව |
|---|---|---|
| (1) | ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය | රාජ්‍ය වියදම් ඉහළ දැමීම |
| (2) | ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය | අයවැය හිඟය පහළ දැමීම |
| (3) | ප්‍රසර්පණ උද්ධමනය | මුදල් සැපයුම ප්‍රසාරණය |
| (4) | අවපාතෝද්ධමනය | අයවැය හිඟය පහළ දැමීම |
| (5) | පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය | රාජ්‍ය අංශයේ වැටුප් ඉහළ යාම |

31. මූලික වශයෙන් වෙළඳපොළ අසාර්ථක වීම් සඳහා හේතුවන කරුණු දෙකක් වනුයේ පහත සඳහන් දෑ අතුරින් කුමක්ද?
(1) දේශපාලන ප්‍රතිපත්තිවල අවිදූර දෘෂ්ටිකත්වය සහ දේශපාලන ස්වාර්ථය
(2) පොදු භාණ්ඩ සඳහා සම්පත් වෙන් නොකිරීම සහ ආදායම් විෂමතාව
(3) ප්‍රමාණය ඉක්මවා බදු අය කිරීම සහ සහනාධාර ලබාදීම
(4) විදේශීය භාණ්ඩ අඩු මිලට පැමිණීම සහ දේශීය නිෂ්පාදිතවලට වක්‍ර බදු පැනවීම
(5) පාරිභෝගිකයින් සහ නිෂ්පාදකයින් ස්වාර්ථයෙන් කටයුතු කිරීම සහ රජය සමාජ සුභ සාධනය සඳහා කටයුතු කිරීම

32. පහත රූපයේ ABC ත්‍රිකෝණයෙන් නිරූපණය කරනු ලබන්නේ කුමක්දැයි හඳුනාගන්න.




(1) පරිභෝජනයේ ධන බාහිරතාවක් හේතු කොටගෙන සිදුවන ඌණ පරිභෝජනයක ප්‍රතිඵලයක් ලෙස අහිමිවන ශුභසාධනය
(2) පරිභෝජනයේ ධන බාහිරතාවක් හේතු කොටගෙන සිදුවන අධි පරිභෝජනයක ප්‍රතිඵලයක් ලෙස අහිමිවන ශුභසාධනය
(3) පරිභෝජනයේ සෘණ බාහිරතාවක් හේතු කොට ගෙන සිදුවන ඌන පරිභෝජනයක ප්‍රතිඵලයක් ලෙස අහිමිවන ශුභසාධනය
(4) පරිභෝජන සහනාධාරයක් හේතු කොට ගෙන සිදුවන අධිපරිභෝජනයක ප්‍රතිඵලයක් හැටියට අහිමිවන ශුභසාධනය
(5) බාහිරතාවක් නිවැරදි කිරීමේ චේතනාවෙන් රජය වෙළඳපොළට මැදිහත් වීම හේතු කොටගෙන අහිමිවන ශුභසාධනය

33. ශ්‍රී ලංකා රජයේ පුනරාවර්තන වියදමට ඇතුළත් නොකරන වියදම පහත සඳහන් දෑ අතුරින් කුමක්ද?
(1) 'අස්වැසුම' සහනාධාර ලාභීන් සඳහා නොමිලේ සහල් ලබාදීමට දරන වියදම
(2) රාජ්‍ය සේවකයින් සඳහා මූලික වැටුපට අමතරව ලබාදෙන දීමනා සඳහා දරන වියදම
(3) දේශීය හා විදේශීය ණය සඳහා පොලී ගෙවීමට දරණ වියදම
(4) රජයේ ණය ආපසු ගෙවීම සඳහා දරන වියදම
(5) විශ්‍රාමික රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීමට දරන වියදම

34. රාජ්‍ය අයවැය ලේඛනයේ ප්‍රාථමික ගිණුමේ හිඟය ලබා ගැනීම සඳහා කළ යුතු නිවැරදි ගැලපීම කුමක්ද?
(1) සමස්ත අයවැය හිඟයට ණය සේවාකරණ ගෙවීම් එකතු කිරීම
(2) සමස්ත අයවැය ශේෂයෙන් ණය සඳහා පොලී ගෙවීම් අඩු කිරීම
(3) සමස්ත අයවැය හිඟයෙන් ණය සේවාකරණ ගෙවීම් අඩු කිරීම
(4) වර්තන ගිණුමේ හිඟයෙන් රාජ්‍ය ණය සඳහා පොලී ගෙවීම් අඩු කිරීම
(5) සමස්ත අයවැය හිඟයෙන් රාජ්‍ය ණය සඳහා පොලී ගෙවීම් අඩු කිරීම

35. රාජ්‍ය අයවැය හිඟය ඉහළ දැමීම අයත් වන්නේ,
(1) ස්වයංක්‍රීය ස්ථායිකරණ ප්‍රතිපත්තිවලටය. (2) සංකෝචනාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියටය.
(3) සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිවලටය. (4) ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තියටය.
(5) ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියටය.

36. රජය දේශීය වෙළඳපොළ මූලාශ්‍රවලින් අයවැය හිඟය පියවීමට විශාල වශයෙන් ණය ගැනීම නිසා වෙළඳපොළ පොලී අනුපාත ඉහළ යාම හේතුකොට ගෙන පෞද්ගලික ආයෝජන අඩුවී ජාතික ආදායම පහළ වැටීම හඳුන්වන්නේ කුමන නමකින්ද?
(1) ෆිස්කල් සම්ප්‍රේෂණ යාන්ත්‍රණය (2) තෙරපීමේ ප්‍රතිවිපාකය
(3) ආර්ථික අවපාතය (4) අවපාතෝද්ධමනය
(5) ව්‍යාපාර චක්‍ර

37. සාපේක්ෂ වාසිය පදනම් කරගත් වෙළඳාමට සහභාගී වීමෙන් රටකට ලැබෙන ප්‍රධානම වාසිය වන්නේ,
(1) දේශීයව නිපදවීමට නොහැකි භාණ්ඩ ආනයනය කළ හැකිවීමය.
(2) තම නිෂ්පාදන හැකියා මායිම පිටතට විතැන් කර ගැනීමට හැකිවීමය.
(3) ඉහළ ආවස්ථික පිරිවැයක් දරා නිපදවිය යුතු භාණ්ඩ අඩු ආවස්ථික පිරිවැයක් යටතේ ආනයනය කළ හැකිවීමය.
(4) අඩු ආවස්ථික පිරිවැයක් යටතේ නිපදවිය හැකි භාණ්ඩ ආනයනය කර නිෂ්පාදන හැකියා වක්‍රයට පිටත පිහිටි භාණ්ඩ සංයෝගයක් පරිභෝජනය කළ හැකි වීමය.
(5) අඩු සම්පත් පිරිවැයක් සහිත භාණ්ඩ නිපදවා අපනයනය කර වැඩි සම්පත් පිරිවැයක් සහිත භාණ්ඩ ආනයනය කළ හැකිවීමය.

38. ශ්‍රී ලංකාවේ ලොකු ළූනු ගොවීන් හට විදේශ තරගයෙන් ආරක්ෂණයක් ලබාදීමට අනුගමනය කළ හැකි ප්‍රතිපත්ති කිහිපයක් පහත දැක්වේ. එයින් වඩාත්ම සඵල ප්‍රතිපත්තිය වනුයේ කුමක්ද?
(1) ආනයනික ලොකු ළූනු මත තීරු බදු ඉහළ නැංවීම සහ ආනයනික යෙදවුම් මත පනවා ඇති තීරු බදු අඩු කිරීම
(2) දේශීය ඉල්ලුම ධෛර්යමත් කිරීම සහ ගොවීන් හට ලබාදෙන පොහොර සහනාධාරය ඉහළ නැංවීම
(3) ආනයනික ලොකු ළූනු සඳහා තීරු බදු අඩුකර දේශීය නිෂ්පාදිත ලොකු ළූනු මත බදු පැනවීම
(4) ආනයනික ලොකු ළූනු සහ දේශීය නිෂ්පාදිත ලොකු ළූනු යන දෙවර්ගයටම සමාන ප්‍රතිශතයකින් නිෂ්පාදන බද්දක් පැනවීම
(5) ආනයනික ලොකු ළූනු මත තීරු බදු ඉහළ නැංවීම සහ දේශීය නිෂ්පාදනයට අවශ්‍ය යෙදවුම් ආනයනය තහනම් කිරීම

39. වර්තමාන ශ්‍රී ලංකාවේ ආනයන සහ අපනයන වෙළඳාම සම්බන්ධයෙන් පහත සඳහන් පිළිතුරු අතුරින් නිවැරදි වන්නේ කුමක්ද?

| | ප්‍රධාන අපනයන අයිතමය | ප්‍රධාන ආනයන අයිතමය | ප්‍රධාන අපනයන දිශාව | ප්‍රධාන ආනයන දිශාව |
|---|---|---|---|---|
| (1) | රෙදි පිළි සහ ඇඟලුම් | ඉන්ධන | එක්සත් ජනපදය | ඉන්දියාව |
| (2) | තේ | ඉන්ධන | එක්සත් ජනපදය | චීනය |
| (3) | රෙදි පිළි සහ ඇඟලුම් | රෙදි පිළි | ඉන්දියාව | ඉන්දියාව |
| (4) | රෙදි පිළි සහ ඇඟලුම් | ඉන්ධන | එක්සත් ජනපදය | චීනය |
| (5) | තේ | ඉන්ධන | එක්සත් ජනපදය | ඉන්දියාව |

40. යම් ආර්ථිකයක 2025 වර්ෂයේදී භාණ්ඩ වෙළෙඳ අනුපාතය 25% කින් ඉහළ ගිය අතර අපනයන මිල දර්ශකය 20% කින් පහළ වැටුනි. 2024 දී ආනයන මිල දර්ශකයේ අගය 100ක් වූයේ නම් 2025 වර්ෂයේ දී ආනයන මිලදර්ශකයේ අගය විය යුත්තේ,
(1) 124 (2) 120 (3) 80 (4) 72 (5) 64

41. ශ්‍රී ලංකාවේ 2022 වර්ෂයේ ගෙවුම් ශේෂ ලේඛනයේ මූල්‍ය ගිණුමේ ශේෂය එක්සත් ජනපද ඩොලර් මිලියන -1568.5කි. මෙයින් අදහස් කරන්නේ කුමක්ද?
(1) ගෙවුම් ශේෂ ලේඛනයේ ඩොලර් මිලියන 1568.5ක හිඟයක් පැවති බවය.
(2) මූල්‍ය ගිණුමේ ඩොලර් මිලියන 1568.5ක හිඟයක් පැවති බවය.
(3) සමස්ත ගිණුමේ ඩොලර් මිලියන 1568.5ක අතිරික්තයක් පැවති බවය.
(4) මූල්‍ය ගිණුම වෙත ශුද්ධ ලැබීම් ඩොලර් මිලියන 1568.5ක් වූ බවය.
(5) ජංගම ගිණුමේ ඩොලර් මිලියන 1568.5ක අතිරික්තයක් පැවති බවය.

42. පහත දැක්වෙන ජාත්‍යන්තර සංවිධාන විසින් ඉටු කරනු ලබන ප්‍රධානම කාර්යයන් නිවැරදිව දැක්වෙන පිළිතුර හඳුනාගන්න.

| | ජාත්‍යන්තර වෙළඳ සංවිධානය | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | ලෝක බැංකුව |
|---|---|---|---|
| (1) | වෙළඳ සම්බාධක පැනවීම | විදේශ විනිමය ගැටලු විසඳීම | ආයෝජන ප්‍රවර්ධනය |
| (2) | වෙළඳ ආරවුල් බේරුම් කිරීම | ගෙවුම් ශේෂ ගැටලු විසඳීම | දරිද්‍රතාව අඩු කිරීම හා සංවර්ධනය |
| (3) | ගෙවුම් ශේෂ ගැටලු විසඳීම | දරිද්‍රතාව තුරන් කිරීම | ආර්ථික සංවර්ධනය |
| (4) | අපනයන ප්‍රවර්ධනය | විදේශ ආධාර සැපයීම | වෙළඳාම ප්‍රවර්ධනය |
| (5) | වෙළඳ ගිවිසුම් ඇති කිරීම | ගෙවුම් ශේෂ ප්‍රමිති සැකසීම | සංවර්ධිත රටවලට ණය දීම |

43. SDR - විශේෂ ගැනුම් හිමිකම් ඒකකයක වටිනාකම තීරණය කිරීමේ දී එයට අදාළ කරගන්නා ජාත්‍යන්තර මුදල් වර්ග පහක් තිබේ. පහත දැක්වෙන මුදල් වර්ග අතුරින් SDR සඳහා සලකා නොබලන මුදල් ඒකකය කුමක්ද?
(1) US ඩොලරය (2) ජපන් යෙන් (3) රෙන්මින්බි (Renminbi)
(4) ජර්මන් මාර්ක් (5) බ්‍රිතාන්‍ය පවුම

44. දුප්පතුන්ට හිතකර ආර්ථික වෘද්ධියක මූලික ලක්ෂණය වන්නේ,
(1) දිගු කාලයක් තිස්සේ ආර්ථික වෘද්ධි අනුපාතිකය ඉහළ මට්ටමක පවත්වාගෙන යාමයි.
(2) ඉහළ ආර්ථික වෘද්ධි අනුපාතිකයක් සමඟ ආදායම් විෂමතාව අඩුවීමයි.
(3) වෘද්ධි ක්‍රියාවලියට ආර්ථිකයේ සියලුම අංශ සම්බන්ධ කර ගැනීමයි.
(4) ආර්ථික වෘද්ධිය සමඟ විශාල වශයෙන් කුටුම්බ සංක්‍රාම සැපයීමයි.
(5) ආර්ථික වෘද්ධියත් සමග කෘෂිකර්මාන්තයේ ඵලදායිතාව ඉහළ යාමයි.

45. ලෝක බැංකු වර්ගීකරණයට අනුව 2023 වර්ෂය වන විට ඉහළ මැදි ආදායම් කාණ්ඩයට අයත් රටක් වනුයේ,
(1) ශ්‍රී ලංකාව (2) ඉන්දියාව (3) බංගලාදේශය
(4) පාකිස්තානය (5) තායිලන්තය

46. පහත සඳහන් දෑ අතුරින් තිරසාර සංවර්ධන අභිමතාර්ථයක් නොවන්නේ කුමක් ද?

(1) ආදායම් ව්‍යාප්තියේ විෂමතා දුරු කිරීම
(2) දිළිඳු බව මුළුමනින්ම පිටුදැකීම
(3) සාගින්න අවසන් කිරීම
(4) ගුණාත්මක අධ්‍යාපනය
(5) ස්ත්‍රී පුරුෂ සමානත්වය

47. ශ්‍රී ලංකාවේ 2019 කුටුම්බ ආදායම් වියදම් සමීක්ෂණයට අනුව පොහොසත්ම කුටුම්බ 20% මුළු ආදායමෙන් ලබාගෙන ඇති ප්‍රතිශතය කුමක්ද?

(1) 50.80
(2) 50.90
(3) 50.95
(4) 51.25
(5) 51.40

48. පුද්ගලයෙකුට අවම ජීවන තත්ත්වයක් පවත්වාගෙන යාමට අවශ්‍ය කරන ආදායම් මට්ටමක් අහිමිවීම හඳුන්වනුයේ කුමන යෙදුමකින්ද?

(1) සාපේක්ෂ දරිද්‍රතාව
(2) බහුමාන දරිද්‍රතාව
(3) නිරපේක්ෂ දරිද්‍රතාව
(4) මානව දරිද්‍රතාව
(5) සමාජීය දරිද්‍රතාව

49. රටක කුටුම්බ ජනගහනයෙන් ආර්ථික වශයෙන් අක්‍රිය ජන සංඛ්‍යාව ඉවත් කළ විට ඉතිරි වන පිරිස අයත් වන්නේ,

(1) සේවා නියුක්තියට
(2) ශ්‍රම බලකායට
(3) විභව ශ්‍රම බලකායට
(4) වැඩිහිටි ජන සංඛ්‍යාවට
(5) වැඩ කළ හැකි වයසේ ජන සංඛ්‍යාවට

50. ශ්‍රී ලංකාවට වැඩි වශයෙන්ම සංචාරකයින් පැමිණෙන කලාපය හඳුනා ගන්න (2021-2022)

(1) අප්‍රිකාව සහ දකුණු ඇමරිකාව
(2) යුරෝපය
(3) ආසියාව
(4) උතුරු ඇමරිකාව
(5) මැදපෙරදිග

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Sabaragamuwa Provincial Department of Education**

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2024
## 13 ශ්‍රේණිය - අවසාන වාර පරීක්ෂණය

ආර්ථික විද්‍යාව II
Economics II

21 S II

13 ශ්‍රේණිය
Grade 13

පැය තුනයි
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
Additional Reading Time – 10

**උපදෙස් :**

- **'අ' උපකොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

### 'අ' උපකොටස

මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.

1.
(I) "භූමියට අයත් සියලුම සම්පත් ආර්ථික සම්පත්වලට අයත් වේ"
මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේද? පිළිතුර පැහැදිලි කරන්න. (ල. 04)

(II)
(අ) ආර්ථික පද්ධතියක් යනු කුමක්ද? එහි කාර්යභාරය කවරේද? (ල. 04)
(ආ) ධනවාදී වෙළඳපොළ ආර්ථික පද්ධතියක දුර්වලතා කවරේද? (ල. 04)

(III)
(අ) නිෂ්පාදන හැකියා වක්‍රයක් මූලයට අවතල හැඩයක් ගැනීමට බලපාන සාධක පැහැදිලි කරන්න. (ල. 04)
(ආ) බටර් හා තුවක්කු පමණක් නිපදවන ආර්ථිකයක පහත දැක්වෙන සිද්ධීන් නිෂ්පාදන හැකියා මායිම් ආදර්ශය මගින් පෙන්නුම් කරන්න.
a. නිෂ්පාදන කාර්යක්ෂමතාව ඉහළ යාම
b. කිරිදෙනුන්ගේ සෞඛ්‍ය පිරිහීම නිසා බටර් කර්මාන්තයේ ඵලදායිතාව අඩුවීම
c. ආර්ථිකය සතුව පැවැති උපයෝජනය නොවූ සම්පත් තොගයක් පූර්ණ ලෙස උපයෝජනය වීම
d. විදුලි බල සැපයුමෙහි අඩපණවීමක් නිසා කර්මාන්ත ශාලාවල වැඩ කරන කාලය අඩුවීම
(ල.1×4= 04)

2.
(I) ඉල්ලුම් නීතිය නිර්වචනය කර එය ක්‍රියාත්මක වීමට බලපාන සාධක සාකච්ඡා කරන්න. (ල. 04)
(II) අනම්‍ය සැපයුම් වක්‍රයක් සහ නම්‍ය සැපයුම් වක්‍රයක් ඇඳ අනම්‍ය සැපයුම හා නම්‍ය සැපයුම අතර වෙනස පැහැදිලි කරන්න. (ල. 04)
(III) (අ) ආදායම් ඉල්ලුම් නම්‍යතාව යන්නෙන් කුමක් අදහස් කෙරේද? එහි අගය මත භාණ්ඩ වර්ගීකරණය කරන්නේ කෙසේද? (ල. 04)
(ආ) හරස් මිල ඉල්ලුම් නම්‍යතාව මත ආදේශක සහ අනුපූරක හඳුනාගන්නේ කෙසේද? (ල. 02)
(IV) තරඟකාරී සහල් වෙළඳපොළක සමතුලිතය මත පහත දැක්වෙන සිදුවීම් ඇති කරන බලපෑම ප්‍රස්තාරිකව පැහැදිලි කරන්න.
(අ) පොහොර සහනාධාරය ඉහළ නැංවීම
(ආ) ආදේශක සහල් ආනයනය මත තීරු බදු ඉහළ නැංවීම
(ඉ) එතනෝල් නිපදවීම සඳහා විශාල වශයෙන් සහල් යොදා ගැනීමට පටන් ගැනීම
(ල.02×03= 06)

3.

(I) තරඟකාරී වෙළඳපොළක ඉල්ලුම Qd=180-3p ද,සැපයුම Qs=-60+5p ද වේ යැයි උපකල්පනය කරන්න.

(අ) වෙළඳපොළ සමතුලිත වන විට මිල, ප්‍රමාණය, පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය ගණනය කරන්න.

(ල. 04)

(ආ) රුපියල් 8 ක නිශ්චිත නිෂ්පාදන සහනාධාරයක් සපයනු ලබයි නම් සනාධාරයෙන් පසු නිෂ්පාදකයින් ලබන මිල, පාරිභෝගිකයින් ගෙවන මිල, සමස්ත අතිරික්තය, අහිමිවන ශුභසාධනය සහ රජයේ සහනාධාර පිරිවැය ගණනය කරන්න.

(ල.01×05=05)

(ඉ) සහනාධාර සැපයීම නිසා ඉහත වෙළඳපොලේ සම්පත් බෙදී යාම අකාර්යක්ෂම වෙන ආකාරය පැහැදිලි කරන්න.

(ල. 04)

(II) තරගකාරී වෙළඳපොළක Qd=240-8p ද Qs=-60+12pද වේ යැයි උපකල්පනය කරන්න. රජය මෙම භාණ්ඩය සඳහා රුපියල් 22 ක සහතික මිලක් ලබාදීමට පොරොන්දු වේ.

(අ) සහතික මිල ලබාදීම සඳහා රජයට වැඩි පිරිවැයක් දැරීමට සිදුවන්නේ අතිරික්තය මිලට ගැනීමෙන් ද නැතිනම් ඌන පූර්ණ ගෙවීම් ක්‍රමය මගින්ද? පැහැදිලි කරන්න.

(ල. 05)

(ආ) රජය ඌණපූර්ණ ගෙවීම සිදුකරන්නේ නම් අහිමිවන ශුභ සාධනය කොපමණද? (ල. 02)

4.

(I) කෙටි කාලයේදී හට ගන්නා හීන වන ආන්තික ඵල සහ දිගු කාලයේ දී හටගන්නා හීනවන පරිමාණානුකූල ඵල එකිනෙකින් වෙනස්වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ල. 04)

(II) පහත සඳහන් දෑ නිර්වචනය කරන්න

(අ) ඍජු පිරිවැය (ආ) වක්‍ර පිරිවැය

(ඉ) ආර්ථික ලාභය (ඊ) ගණකාධිකාරී ලාභය

(ල. 01×04=04)

(III) "කෙටි කාලයේදී මිල අවම සාමාන්‍ය මුළු පිරිවැයට වඩා අඩු නම් පූර්ණ තරගකාරී ආයතනයක් වසා දමයි". මෙම ප්‍රකාශය විමසන්න.

(ල. 04)

(IV) කතිපයාධිකාරය ඒකාධිකාරී තරගයෙන් වෙනස් වන්නේ කෙසේද?

(ල. 04)

(V) ශ්‍රී ලංකාවේ ඇති පහත සඳහන් කර්මාන්ත වඩාත්ම ආසන්න වන්නේ කුමන වෙළඳපොළ ව්‍යුහයටද?

(අ) බෝංචි (ආ) රූපලාවන්‍ය සේවා

(ඉ) සිසිල් බීම (ඊ) රැහැන් දුරකථන සේවා (ල. 01×04=04)

5. (I) ආර්ථිකයකට අදාළව 2024 වර්ෂය සඳහා ජාතික ගිණුම් සංඛ්‍යා දත්ත කීපයක් පහත දැක්වේ සියලු අගයන් රුපියල් බිලියනවලින්ය.

- කෘෂි අංශයේ දළ එකතු කළ වටිනාකම = 1600
- දළ මිශ්‍ර ආදායම = 4000
- පෞද්ගලික පාරිභෝජනය = 12000
- විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම = 2800
- සේවක ආදායම් = 5000
- සේවා අංශයේ දළ එකතු කළ වටිනාකම =10000
- නිෂ්පාදිතය මතබදු- එම සහනාධාර = 2400
- අපනයන = 5000
- ආනයන = 7000
- නිෂ්පාදනය මත වෙනත් බදු -එම සහනාධාර = 600
- කාර්මික අංශයේ දළ එකතු කල වටිනාකම = 8000
- දළ මෙහෙයුම් අතිරික්තය = 10000
- දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය = 5600
- රජයේ මිලදී ගැනීම් = 6400
- විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම = -800
- ස්ථාවර ප්‍රාග්ධන පාරිභෝජනය = 4000

පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) ආදායම් ක්‍රමයට දළ ජාතික ආදායම
(ආ) වියදම් ක්‍රමයට දළ ජාතික ආදායම
(ඉ) නිමැවුම් ක්‍රමයට දළ ජාතික ආදායම
(ඊ) වැයකළ හැකි දළ ජාතික ආදායම
(උ) දේශීය ඉතුරුම්
(ඌ) ජාතික ඉතුරුම්

(ල. 02×06=12)

(II) ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය; C=1800+0.8Yd යැයි උපකල්පනය කරන්න.

(අ) රජය රාජ්‍ය වියදම සහ ස්ථාවර බදු රුපියල් බිලියන 100 බැගින් එක්වර ඉහළ දැමුවහොත් සමතුලිත ජාතික ආදායමට සිදුවන බලපෑම පැහැදිලි කරන්න.

(ල. 04)

(ආ) මෙම ආර්ථිකයේ ස්වාධීන ආයෝජනය රුපියල් බිලියන 75 කින් ඉහළ ගියහොත් පාරිභෝජන වියදමට සිදුවන බලපෑම ගණනය කරන්න.

(ල. 02)

(ඉ) මෙම ආර්ථිකයේ ශුද්ධ බදු ;Tn= රු.බි.1000ක්ද ,ශුද්ධ අපනයන ශුන්‍ය අගයක් ද නම් ජාතික ආදායම් මට්ටම රුපියල් බිලියන 10,000දී සාමාන්‍ය ඉතුරුම් නැමියාව ගණනය කරන්න.

(ල. 02)

## "ආ" උපකොටස

මෙම කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරාගන්න.

6.

(I) (අ) M2b පුළුල් මුදල් සැපයුමට ඇතුළත් වන මහජනයා සතු වත්කම් කවරේ ද?

(ල. 03)

(ආ) M2b මුදල් සැපයුම ඉහළ යාමට තුඩුදෙන සාධක කවරේද?

(ල. 03)

(II) MV=PY විනිමය සමීකරණය මුදල් ප්‍රමාණවාදී විග්‍රහයට සම්බන්ධ වන ආකාරය විමසන්න.

(ල. 04)

(III) ඉල්ලුම් උද්ධමනය පාලනය කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය භාවිත කරන ආකාරය පැහැදිලි කරන්න.

(ල. 04)

(IV) ශ්‍රී ලංකා මහ බැංකුව වාණිජ බැංකු පද්ධතියේ ණය සැපයුම සීමා කිරීම සඳහා ප්‍රතිපත්ති උපකරණ භාවිත කරන ආකාරය සාකච්ඡා කරන්න.

(ල. 06)

7.

(I) "නිෂ්පාදනයේ සෘණ බාහිරතා පවතින විට සම්පත් බෙදී යාම අකාර්යක්ෂම වේ "මෙම ප්‍රකාශය රූපසටහනක් භාවිතයෙන් පැහැදිලි කරන්න.

(ල. 04)

(II) (අ) බදු මූලධර්ම නම් කරන්න.

(ල. 03)

(ආ) බදු අය කිරීමේ ‘‘සාධාරණත්වය’’ යන්නෙන් කුමක් අදහස් කරනු ලබයිද? පැහැදිලි කරන්න.

(ල. 03)

(III) වර්තමානයේදී ශ්‍රී ලංකා රජයේ අයභාරය තුළ ප්‍රධාන බදු මූලාශ්‍ර දෙකක් හා බදු නොවන මූලාශ්‍ර දෙකක් දක්වන්න.

(ල. 04)

(IV) (අ) රාජ්‍ය අයවැය හිඟය පියවීමේ ප්‍රධාන මූලාශ්‍ර කවරේද?

(ල. 03)

(ආ) බැංකු සහ බැංකු නොවන මූලාශ්‍ර භාවිතයෙන් අයවැය හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රතිවිපාක සාකච්ඡා කරන්න.

(ල. 03)

8.

(I) (අ) විදේශ වෙළෙඳාමට සහභාගි වීමෙන් රටකට ලැබෙන ප්‍රතිලාභ කවරේද?

(ල. 03)

(ආ) විදේශ වෙළඳාමේ නිරපේක්ෂ වාසිය සහ සාපේක්ෂ වාසිය අතර වෙනස කුමක්ද?

(ල. 02)

(ඉ) සාපේක්ෂ වාසි හට ගැනීමට හේතු කවරේද?

(ල. 03)

(II) සඵළ ආරක්ෂණ අනුපාතිකය (ERP) යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද එහි අගය අඩුවීමට බලපාන සාධක කවරේද?

(ල. 04)

(III) වර්තමානයේදී ගෙවුම් ශේෂ ලේඛනයේ සමස්ත ශේෂය ලබා ගන්නේ කෙසේද?

(ල. 04)

(IV) පාවෙන විනිමය අනුපාතය අධිප්‍රමාණ (appreciate) වීමට හේතුවන සාධක කවරේද?

(ල. 04)

9.

(I) ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී ආර්ථික වෘද්ධියට අමතරව ආර්ථිකයේ ව්‍යුහමය වෙනස්කම් සිදුවේ.
(අ) ආර්ථික වෘද්ධිය රූප සටහනක් මගින් පැහැදිලි කරන්න.

(ල. 03)

(ආ) ආර්ථික වෘද්ධියත් සමග සිදුවන ව්‍යුහමය වෙනස්කම් කවරේද?

(ල. 03)

(II) ප්‍රජා විද්‍යා සංක්‍රාන්තිය තුළ දළ උපත් අනුපාතය සහ දළ මරණ අනුපාතය හැසිරෙන ආකාරය පැහැදිලි කරන්න.

(ල. 04)

(III) (අ) ජාතික දරිද්‍රතා රේඛාව යනු කුමක්ද?

(ල. 02)

(ආ) දරිද්‍රතාව අඩු කිරීමට යෝග්‍ය ප්‍රතිපත්ති කවරේද?

(ල. 04)

(IV) "ශ්‍රී ලංකාවේ පුරුෂ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකයට වඩා ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය ඉතා පහළ අගයක් ගනී "මෙයට බලපා ඇති සාධක නම් කරන්න.

(ල. 04)

10.

(I) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කළ ප්‍රධාන සමාජ ආරක්ෂණ වැඩසටහන් කවරේද?

(ල. 05)

(II) 1977 දී සිදුකළ මෙරට ප්‍රධාන ආර්ථික ප්‍රතිසංස්කරණ කවරේද?

(ල. 05)

(III) වර්තමාන ශ්‍රී ලංකාව මුහුණ දී ඇති විදේශ විනිමය අර්බුධයට විසඳුම් ඉදිරිපත් කරන්න.

(ල. 05)

(IV) මැද පෙරදිග යුද ගැටුම් මෙරට ආර්ථිකයට ඇති කරන බලපෑම විමසන්න.

(ල. 05)

අ.පො.ස. (උ.පෙළ) විභාගය 2024

21 ආර්ථික විද්‍යාව

අවසන් වාර පරීක්ෂණය - සබරගමුව පළාත

ලකුණු දීමේ පටිපාටිය

I පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 1 (4) | 11 (5) | 21 (3) | 31 (2) | 41 (4) |
| 2 (4) | 12 (3) | 22 (4) | 32 (1) | 42 (2) |
| 3 (5) | 13 (1) | 23 (3) | 33 (4) | 43 (4) |
| 4 (1) | 14 (5) | 24 (2) | 34 (5) | 44 (2) |
| 5 (2) | 15 (4) | 25 (2) | 35 (5) | 45 (5) |
| 6 (3) | 16 (2) | 26 (1) | 36 (2) | 46 (1) |
| 7 (2) | 17 (3) | 27 (5) | 37 (3) | 47 (5) |
| 8 (3) | 18 (5) | 28 (5) | 38 (1) | 48 (3) |
| 9 (3) | 19 (5) | 29 (3) | 39 (1) | 49 (2) |
| 10 (1) | 20 (2) | 30 (1) | 40 (5) | 50 (2) |

CamScanner

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education
சபரகமுவ மாகாணக் கல்வி திணைக்களம்

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2024
## අවසාන වාර පරීක්ෂණය

| | | |
|---|---|---|
| ආර්ථික විද්‍යාව II<br>Economics II | 21 S II | 13 ශ්‍රේණිය<br>Grade 13 |
| පැය තුනයි<br>Three Hours | | අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.<br>Additional Reading Time – 10 minutes |

උපදෙස් :

- 'අ' උපකොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

'අ' උපකොටස

මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.

01)

I. "භූමියට අයත් සියලුම සම්පත් ආර්ථික සම්පත්වලට අයත් වේ"
මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේද? පිළිතුර පැහැදිලි කරන්න.

මෙම ප්‍රකාශයට එකඟ නොවේ.

- භූමිය ලෙස ආර්ථික විද්‍යාවේදී හඳුන්වන්නේ භාණ්ඩ හා සේවා නිපදවීමට යෙදවුම් ලෙස භාවිත කළ හැකි සියලුම ස්වභාවික සම්පත්ය.
- බොහෝ ස්වාභාවික සම්පත් මිනිස් උවමනාවන්ට සාපේක්ෂව ප්‍රමාණවත්ව නොතිබෙන නිසා ඒවා භාවිත කිරීමේදී අවස්ථික පිරිවැයක් දැරීමට සිදුවන බැවින් එම සම්පත් ආර්ථික සම්පත් වලට අයත් වේ.
උදා:- ඛනිජ තෙල්, ඉඩම්, පිරිසිදු පානීය ජලය, වනාන්තර, ගල් අඟුරු
- කෙසේ වෙතත් භූමියට අයත් සමහර සම්පත් ඒවා සැපයෙන අවස්ථාවලදී අවස්ථික පිරිවැයකින් තොරව භාවිත කළ හැකි නිසා ආර්ථික නොවන සම්පත්වලට ඇතුළත් කෙරේ.
උදා:- වර්ෂා ජලය, මුහුදු ජලය, හිරු එළිය, වායුගෝලීය වාතය, සුළං
- මේ අනුව භූමි සාධකය තුළ ආර්ථික සම්පත් මෙන්ම ආර්ථික නොවන සම්පත්ද පවතී. ආර්ථික නොවන සම්පත් අවස්ථික පිරිවැයකින් තොරව නිෂ්පාදන කටයුතුවලට යොදා ගත හැකි වුවද එම සම්පත් නොමැතිව නිෂ්පාදන කටයුතු කළ නොහැක.

(කරුණු 4ට ල. 04)

II.

(අ) ආර්ථික පද්ධතියක් යනු කුමක්ද? එහි කාර්යභාරය කවරේද?

- මිනිස් වුවමනාවන් තෘප්තිමත් කිරීම සඳහා හිඟ සම්පත් භාවිත කිරීමේදී සමාජයක් මුහුණ දෙන මූලික තේරීමේ ප්‍රශ්න විසඳා ගැනීම සඳහා මිනිසුන් විසින් ගොඩනගා ගෙන ඇති සුවිශේෂී යාන්ත්‍රණය නැතිනම් සමාජ සංවිධානය ආර්ථික පද්ධතියයි. එමගින් මිනිස් වුවමනා තෘප්තිමත් කිරීම සඳහා හිඟ සම්පත් කළමනාකරණයක් සිදුවේ.

(ල. 01)



CamScanner

- ආර්ථික පද්ධතියකින් ඉටුකෙරෙන ප්‍රධාන කාර්යයන් තුනක් තිබේ.
  1. කුමක් කොපමණ නිපදවන්නේ ද යන්න තීරණය කිරීම.
  2. කෙසේ නිපදවන්නේ ද යන්න තීරණය කිරීම.
  3. කා සඳහා නිපදවන්නේ ද යන්න තීරණය කිරීම.

(ල. 03)

(ආ) ධනවාදී වෙළඳපොළ ආර්ථික පද්ධතියක දුර්වලතා කවරේද?

- ධනවාදී වෙළඳපොළ ආර්ථිකයක් ලෙස සැලකෙන්නේ මූලික ආර්ථික ප්‍රශ්න මිල යාන්ත්‍රණය මගින් විසඳාගනු ලබන සම්පත්වල හිමිකම පෞද්ගලික අංශය සතු ආර්ථික පද්ධතියකි. එහි දුර්වලතා රාශියක් දක්නට ලැබේ.

  - ආදායම් හා ධනය අසමාන ලෙස බෙදී යාම.
  - උද්ධමනය සේවා විශුක්තිය හා ආර්ථික පසු බැසීම ආදී සාර්ව ආර්ථික අස්ථායිතාවන් චක්‍රීයව හට ගැනීම.
  - අපූර්ණ හෝ අසමමිතික තොරතුරු නිසා ආර්ථික කාරකවල තීරණ ප්‍රශස්ත නොවීම.
  - පූර්ණ තරගය වෙනුවට වෙළඳපොළ බලය සං කේන්ද්‍රණය වීම නිසා පාරිභෝගිකයින් සූරා කෑමට ලක්වීම.
  - පෞද්ගලික අංශයි පොදු භාණ්ඩ නොසැපයීම.
  - ආර්ථික කාරක තීරණ ගැනීමේ දී බාහිරතා නොසැලකීම.
  - දැඩි තරඟය නිසා ගොඩනැගෙන සමාජ අසහනය.
  - සමාජය ස්තරවලට බෙදීම.
  - අවගුණ භාණ්ඩ අධිපරිභෝජනය හා ගුණසාධා භාණ්ඩ ඌන පරිභෝජන

(ඕනෑම කරුණු 4කට ල. 04)

III.

(අ) නිෂ්පාදන හැකියා වක්‍රයක් මූලයට අවතල හැඩයක් ගැනීමට බලපාන සාධක පැහැදිලි කරන්න.

- මූලයට අවතල හැඩයක් ගන්නේ වැඩිවන අවස්ථික පිරිවැය තත්ත්වය නැතිනම් වැඩිවන අවස්ථික පිරිවැය නීතිය ක්‍රියාත්මක වීම නිසාය.

(ල. 01)

- කර්මාන්තය ප්‍රසාරණය වෙන විට ආවස්ථික පිරිවැය / ආන්තික අවස්ථික පිරිවැය ඉහළ යාමට හේතු වන කරුණු තුනක් තිබේ.

  1. සම්පත් සමජාතිය නොවීම. ( සම්පත් පූර්ණ ආදේශක නොවීම.)
  2. එක් භාණ්ඩයක තාක්ෂණය අනෙක් භාණ්ඩයට නොගැලපීම.
  3. එක් භාණ්ඩයකට යෝග්‍ය සම්පත් තවත් භාණ්ඩයකට අයෝග්‍ය වීම.


(ල. 03)




CamScanner

(ආ) බටර් හා තුවක්කු පමණක් නිපදවන ආර්ථිකයක පහත දැක්වෙන සිද්ධීන් නිෂ්පාදන හැකියා මායිම් ආදර්ශය මගින් පෙන්නුම් කරන්න.


a. නිෂ්පාදන කාර්යක්ෂමතාව ඉහළ යාම




b. කිරිදෙනුන්ගේ සෞඛ්‍ය පිරිහීම නිසා බටර් කර්මාන්තයේ ඵලදායිතාව අඩුවීම





c. ආර්ථිකය සතුව පැවැති උපයෝජනය නොවූ සම්පත් තොගයක් පූර්ණ ලෙස උපයෝජනය වීම






CamScanner

d. විදුලි බල සැපයුමෙහි අඩපණවීමක් නිසා කර්මාන්ත ශාලාවල වැඩ කරන කාලය අඩුවීම





(නි. හැ. වක්‍රයේ හැඩය අදාළ නොවේ.) (ල.1×4= 04)

02)

I. ඉල්ලුම් නීතිය නිර්වචනය කර එය ක්‍රියාත්මක වීමට බලපාන සාධක සාකච්ඡා කරන්න.

- නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ භාණ්ඩයක ඉල්ලුමට බලපාන එහි මිල හැර අනෙකුත් සාධක ස්ථාවරව පවතී නම්, භාණ්ඩයේ මිලත් ඉල්ලුම් ප්‍රමාණයත් අතර ප්‍රතිලෝම (සෘණ) සම්බන්ධතාවක් පවතින බව ඉල්ලුම් නීතියයි. මෙම නීතිය ක්‍රියාත්මක වීමට බලපාන සාධක දෙකක් තිබේ එනම් ආදායම් ප්‍රතිවිපාකය හා ආදේශන ප්‍රතිවිපාකය යි. (ල.2)
- අනෙකුත් සාධක නොවෙනස්ව පවතින විට මිල ඉහළ යාම නිසා පාරිභෝගිකයින්ගේ මූර්ත ආදායම අඩුවීම හේතු කොටගෙන ඉල්ලුම් ප්‍රමාණය අඩුවීම හෝ මිල පහළ යන විට මූර්ත ආදායම ඉහළ යාම නිසා ඉල්ලුම් ප්‍රමාණය වැඩිවීම ආදායම් ප්‍රතිවිපාකය මගින් ඉල්ලුම් නීතිය ක්‍රියාත්මක වීම සිදුවේ. (ල.1)
- අනෙකුත් සාධක නොවෙනස්ව පවතින විට මිල ඉහළ යාම නිසා භාණ්ඩයේ සාපේක්ෂ මිල ඉහළ යාම හේතු කොට ගෙන ඉල්ලුම් ප්‍රමාණයේ අඩුවීම හෝ මිල පහළ යන විට සාපේක්ෂ මිල අඩුවීම හේතු කොටගෙන ඉල්ලුම් ප්‍රමාණයේ වැඩිවීම මගින් ආදේශන ප්‍රතිවිපාකය ඔස්සේ ඉල්ලුම් නීතිය ක්‍රියාත්මක වේ. (ල.1)


II. අනම්‍ය සැපයුම් වක්‍රයක් සහ නම්‍ය සැපයුම් වක්‍රයක් ඇඳ අනම්‍ය සැපයුම හා නම්‍ය සැපයුම අතර වෙනස පැහැදිලි කරන්න.




අනම්‍ය සැපයුම් වක්‍රය
ධන තිරස් අන්තඃඛණ්ඩයකින් ආරම්භ වී සරල රේඛීයව ඉහළට බෑවුම් වේ.



CamScanner




නම්‍ය සැපයුම් වක්‍රය
ධන සිරස් අන්තඃඛණ්ඩයකින් ආරම්භ වී සරල රේඛීයව ඉහළට බෑවුම් වේ.

(රූප සටහන් නිවැරදිව ඇඳ තිබේ නම් ලකුණු 1 බැගින් ලකුණු 2 යි.)

- භාණ්ඩයක මිල වෙනස්වන ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයකින් සැපයුම් ප්‍රමාණය වෙනස්වීම නම්‍ය සැපයුම ලෙස සැලකෙන අතර එවිට මිල සැපයුම් නම්‍යතාව 1 ට වඩා වැඩි අගයක් ගනී.

(ල. 01)

- භාණ්ඩයක මිල වෙනස්වන ප්‍රතිශතයට වඩා අඩු ප්‍රතිශතයකින් සැපයුම් ප්‍රමාණය වෙනස්වීම අනම්‍ය සැපයුම ලෙස සැලකෙන අතර එවිට මිල සැපයුම් නම්‍යතාව බිංදුවත් එකක් අතර අගයක් ගනී.

(ල. 01)

III. (අ) ආදායම් ඉල්ලුම් නම්‍යතාව යන්නෙන් කුමක් අදහස් කෙරේද? එහි අගය මත භාණ්ඩ වර්ගීකරණය කරන්නේ කෙසේද?

- පාරිභෝගික ආදායමෙහි වෙනසකට භාණ්ඩයක ඉල්ලුම දක්වන ප්‍රතිචාරය හෝ සංවේදීතාව ආදායම් - ඉල්ලුම් නම්‍යතාවයි. ඉල්ලුම් ප්‍රමාණයේ ප්‍රතිශතයක වෙනස ආදායමේ ප්‍රතිශතක වෙනසින් බෙදීමෙන් ආදායම් ඉල්ලුම් නම්‍යතාව මැනිය හැක

(ල. 01)

- භාණ්ඩයක ආදායම් ඉල්ලුම් නම්‍යතාව ධන අගයක් ගන්නේ නම් එය සාමාන්‍ය භාණ්ඩයක් ලෙස සැලකෙන අතර සාමාන්‍ය භාණ්ඩ ද නැවත අත්‍යවශ්‍ය භාණ්ඩ හා සුඛෝපබෝගී භාණ්ඩ ලෙස කොටස් දෙකකට බෙදේ. ආදායම් ඉල්ලුම් නම්‍යතාව බිංදුවේ සිට එක දක්වා අගයක් ගන්නා සාමාන්‍ය භාණ්ඩ අත්‍යවශ්‍ය භාණ්ඩ ලෙස සැලකෙන අතර ආදායම් ඉල්ලුම් නම්‍යතාව එකට වඩා වැඩි අගයක් ගන්නා සාමාන්‍ය භාණ්ඩ සුඛෝපභෝගී භාණ්ඩ ලෙස හැඳින්වේ.

(ල. 02)

- ආදායම් ඉල්ලුම් නම්‍යතාව සෘණ අගයක් ගන්නා භාණ්ඩ බාල භාණ්ඩ ලෙස සැලකේ

(ල. 01)

(ආ) හරස් මිල ඉල්ලුම් නම්‍යතාව මත ආදේශක සහ අනුපූරක හඳුනාගන්නේ කෙසේද?

- හරස් මිල එල්ලුම් නම්‍යතාව, යම් භාණ්ඩ දෙකක් අතර ධන අගයක් ගනී නම් ඒවා ආදේශක වේ.
උදා:- කෝලි කුට්ටු කෙසෙල් සහ ඇඹුල් කෙසෙල්

(ල. 01)

- හරස් මිල ඉල්ලුම් නම්‍යතාව, යම් භාණ්ඩ දෙකක් අතර සෘණ අගයක් ගනියි නම් ඒවා අනුපූරක වේ.
උදා:- බටර් හා පාන්


(ල. 01)



CamScanner


IV. (අ) තරගකාරී සහල් වෙළඳපොළක සමතුලිතය මත පහත දැක්වෙන සිදුවීම් ඇති කරන බලපෑම ප්‍රස්තාරිකව පැහැදිලි කරන්න.

(අ) පොහොර සහනාධාරය ඉහළ නැංවීම




- පොහොර සහනාධාරය නිසා නිෂ්පාදන පිරිවැය අඩුවීමෙන් සැපයුම ඉහළ ගොස් සැපයුම් වක්‍රය දකුණට විතැන් වී සමතුලිත මිල පහළ වැටෙන අතර සමතුලිත ප්‍රමාණය වැඩි වේ.

(ආ) ආදේශක සහල් ආනයනය මත තීරු බදු ඉහළ නැංවීම





- ආදේශක සහල් මත තීරු බදු පැනවීම නිසා පාරිභෝගිකයින් ඒ වෙනුවට දේශීය සහල් ආදේශ කිරීම හේතු කොටගෙන දේශීය සහල් ඉල්ලුම වැඩි වී සමතුලිත මිල සහ ප්‍රමාණය යන දෙකම ඉහළ යයි.



CamScanner

(ඉ) එතනෝල් නිපදවීම සඳහා විශාල වශයෙන් සහල් යොදා ගැනීමට පටන් ගැනීම





- එතනෝල් නිපදවීමටත් සහල් ඉල්ලුම් කරන විට වෙළඳපොලේ සහල් ඉල්ලුම ඉහළ ගොස් ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වී සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය යන දෙකම ඉහළ යයි.

(රූප සටහනක් නිවැරදිව ඇඳීමට ල. 1ක් සහ නිවැරදි පැහැදිලි කිරීමට ල. 1ක් බැගින් ලකුණු 06)

03)

I. තරඟකාරි වෙළඳපොළක ඉල්ලුම Qd=180-3p ද,සැපයුම Qs=-60+5p ද වේ යැයි උපකල්පනය කරන්න.

(අ) වෙළඳපොළ සමතුලිත වන විට මිල, ප්‍රමාණය, පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය ගණනය කරන්න.




(රූප සටහන අත්‍යවශ්‍ය නොවේ)

සමතුලිත මිල
$$QS = QD$$
$$-60 + 5P = 180 - 3P$$
$$8P = 240$$
$$\underline{P = 30} \qquad (ල.\ 1)$$

සමතුලිත ප්‍රමාණය
$$Q = 180 - 3(30)$$
$$\underline{Q = 90} \qquad (ල.\ 1)$$


පාරිභෝගික අතිරික්තය
$$= \frac{(60 - 30)\ 90}{2}$$
$$= \underline{1350} \qquad (ල.\ 1)$$

නිෂ්පාදන අතිරික්තය
$$= \frac{(30 - 12)\ 90}{2}$$
$$= \underline{810} \qquad (ල.\ 1)$$



CamScanner

(ආ) රුපියල් 8 ක නියමිත නිෂ්පාදන සහනාධාරයක් සපයනු ලබයි නම් සහනාධාරයෙන් පසු නිෂ්පාදකයින් ලබන මිල, පාරිභෝගිකයින් ගෙවන මිල, සමස්ත අතිරික්තය, අහිමිවන ශුභසාධනය සහ රජයේ සහනාධාර පිරිවැය ගණනය කරන්න.




(රූප සටහන අනුපාතික නොවේ)

සහනාධාරයෙන් පසු

- නිෂ්පාදකයින් ලබන මිල = වෙළඳපොළ මිල + සහනාධාරය

  $Q_{S_1} = QD$

  $-60 + 5(P + 8) = 180 - 3P$

  $-20 + 5P = 180\ 3P$

  $8P = 200$

  $P = 25$

  නිෂ්පාදකයින් ලබන මිල = 25 + 8

  = <u>33</u>

  (ල. 1)

- පාරිභෝගිකයින් ගෙවන මිල = නව සමතුලිත මිල

  $-20 + 5P = 180 - 3P$

  $8P = 200$

  $\underline{P = 25}$ (ල. 1)

- සමස්ත අතිරික්තය = පාරිභෝගික අතිරික්තය + නිෂ්පාදන අතිරික්තය

  $= \frac{(60-25)\,105}{2} + \frac{(33-12)\,105}{2}$

  $= 1837.5 + 1102.5$

  $= \underline{2940}$

  (ල. 1)

- අහිමිවන ශුභසාධනය $= \frac{(105-90)\,(33-25)}{2}$

  $= \underline{60}$

  (ල. 1)

- රජයේ සහනාධාර පිරිවැය $= 8 \times 105$

  $= \underline{840}$

  (ල. 1)



CamScanner


(ඉ) සහනාධාර සැපයීම නිසා ඉහත වෙළඳපොලේ සම්පත් බෙදී යාම අකාර්යක්ෂම වෙන ආකාරය පැහැදිලි කරන්න.

- සම්පත් බෙදී යාම කාර්යක්ෂම වීම සඳහා භාණ්ඩයේ මිල ආන්තික පිරිවැයට සමාන විය යුතුය.
- සහනාධාරයෙන් පසු භාණ්ඩයේ මිල (ආන්තික ප්‍රතිලාභය) 25ක් වන නමුත් ආන්තික පිරිවැය 33කි.
- ආන්තික පිරිවැය ආන්තික ප්‍රතිලාභය ඉක්මවා යන බැවින් කාර්යක්ෂම මට්ටම ඉක්මවා පරිභෝජනය / නිෂ්පාදනය වීමක් සිදුවේ.
- අකාර්යක්ෂම මට්ටමක් නිපදවීම නිසා අහිමිවන සුභසාධනය 60කි.

(කරුණු 4ට ල. 04)

II. තරගකාරී වෙළඳපොළක Qd=240-8p ද Qs=-60+12pද වේ යැයි උපකල්පනය කරන්න. රජය මෙම භාණ්ඩය සඳහා රුපියල් 22 ක සහතික මිලක් ලබාදීමට පොරොන්දු වේ.


(අ) සහතික මිල ලබාදීම සඳහා රජයට වැඩි පිරිවැයක් දැරීමට සිදුවන්නේ අතිරික්තය මිලට ගැනීමෙන් ද නැතිනම් ඌන පූර්ණ ගෙවීම් ක්‍රමය මගින්ද? පැහැදිලි කරන්න.




(ල. 1)

අතිරික්තය මිලට ගැනීමට දැරිය යුතු පිරිවැය = (204 – 64) 22
= 3080

(ල. 1)




(ල.1)

ඌණ පූර්ණ ගෙවීම සඳහා දැරිය යුතු පිරිවැය = (22 – 4.5) 204
= 17.5 × 204
= 3570

(ල. 1)

- රජයට වැඩි වියදමක් දැරීමට සිදුවන්නේ ඌණ පූර්ණ ගෙවීම සඳහාය.

(ල. 1)



CamScanner

(ආ) රජය ඌණපූර්ණ ගෙවීම සිදුකරන්නේ නම් අහිමිවන ශුභ සාධනය කොපමණද?

ඌණ පූර්ණ ගෙවීම සිදු කරයි නම් අහිමිවන සුභසාධනය $= \frac{(204 - 120)(22 - 4.5)}{2}$ (ල. 1)

$= \frac{84 \times 17.5}{2}$

$= 735$ (ල. 1)

04)

I. කෙටි කාලයේදී හට ගන්නා හීන වන ආන්තික ඵල සහ දිගු කාලයේ දී හටගන්නා හීනවන පරිමාණානුකූල ඵල එකිනෙකින් වෙනස්වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

- කෙටි කාලයේදී ස්ථාවර සාධක සමඟ විචල්‍ය සාධකය සේවා නියුක්ත කරමින් නිෂ්පාදනය ඉහළ දමන විට විචල්‍ය සාධකයේ ආන්තික ඵලදාව පහළ වැටීම හීනවන ආන්තික ඵල යනුවෙන් හැඳින්වේ.
- දිගු කාලයේදී ආයතනයක් සියලු යෙදවුම් සමානුපාතිකව ඉහළ දමමින් නිෂ්පාදනය කරන විට යෙදවුම් වෙනස් කරන ප්‍රතිශතයට වඩා අඩු ප්‍රතිශතයකින් නිමැවුම වෙනස්වීම හීනවන පරිමාණානුකූල ඵල ලෙස හැඳින්වේ.
- හීනවන ඵල හටගන්නා විට ආයතනයේ ධාරිතාව (පරිමාණය) ස්ථාවරව පවතින නමුත් හීනවන පරිමාණානුකූල ඵල හටගන්නා විට ආයතනය ධාරිතාව (පරිමාණය) විශාල වෙයි.
- හීනවන ඵල ලැබීමට හේතුව ස්ථාවර සාධකවලට නොගැලපෙන ආකාරයට විචල්‍ය සාධකයේ අනුපාතය ඉහල යාමයි. නමුත් හීන වන පරිමාණානුකූල ඵල හට ගන්නේ ආයතනය පාලනය කිරීමට නොහැකි තරම්. විශාල වීම නිසා පරිපාලන දුෂ්කරතා හට ගැනීමයි.

(කරුණු 4ට ල. 04)

II. පහත සඳහන් දෑ නිර්වචනය කරන්න

(අ) ඍජු පිරිවැය

ව්‍යාපාරික ආයතනයක් පිටතින් යෙදවුම් මිලදී ගැනීම සඳහා දරන අවස්ථික පිරිවැය ඍජු පිරිවැයයි. උදා:- අමුද්‍රව්‍ය හා ශ්‍රම පිරිවැය

(ආ) වක්‍ර පිරිවැය

ව්‍යාපාරික ආයතනයක් නිෂ්පාදන කටයුතුවලට ආයතනය සතු යෙදවුම් භාවිත කිරීම නිසා අහිමිවන ආදායම් වක්‍ර පිරිවැයයි. උදා:- ප්‍රාමාණික ලාභය සහ ආර්ථික ක්ෂයවීම.

(ඉ) ආර්ථික ලාභය

ආයතනයක මුළු අයභාරයෙන් මුළු ආර්ථික පිරිවැය (ඍජු පිරිවැය සහ වක්‍ර පිරිවැය) අඩු කළ විට ඉතිරි වන ප්‍රමාණය ආර්ථික ලාභයයි. මෙය ධන,ඍණ හෝ ශුන්‍ය විය හැක.

(ඊ) ගණකාධිකාරී ලාභය

ආයතනයක මුළු අයභාරයෙන් මුළු ඍජු පිරිවැය (ගණකාධිකාරී පිරිවැය) අඩුකළ විට ඉතිරි වන කොටස ගණකාධිකාරී ලාබයයි.

(ල. 01×04=04)



CamScanner

III. "කෙටි කාලයේදී මිල අවම සාමාන්‍ය මුළු පිරිවැයට වඩා අඩු නම් පූර්ණ තරගකාරී ආයතනයක් වසා දමයි". මෙම ප්‍රකාශය විමසන්න.

- කෙටි කාලයේදී භාණ්ඩයේ මිල අවම සාමාන්‍ය මුළු පිරිවැයට වඩා අඩු වුවද තාර්කික ආයතනයක් වසා දැමීමට තීරණය නොකරයි.
- ආයතනය වසා දැමීමට තීරණය කරන්නේ මිල අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා අඩු වුවහොත් පමණකි.
- භාණ්ඩයේ මිල අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැය සහ අවම සාමාන්‍ය මුළු පිරිවැය අතර පරාසයේදී ආයතනය පාඩු ලැබුවද වසා දැමීමට තීරණය නොකරයි.
- ආයතනයකට කෙටි කාලයේදී වෙළඳපොළේ රැඳී සිටීමට අවශ්‍ය වන්නේ මුලු අයභාරය මුළු විචල්‍ය පිරිවැයට සමාන හෝ විශාල අගයක් ගැනීම පමණයි. ඒ සඳහා මිල අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන හෝ වැඩි විය යුතුය.
- මිල අවම ATC ට වඩා අඩු වුවද අවම AVC ට වඩා වැඩි නම් ආයතනයට වෙළඳපොළේ රැඳී සිටීම තුළින් ස්ථාවර පිරිවැයෙන් කොටසක් ආවරණය කර කරගත හැක. ආයතනය වසා දැමුවොත් එය මුළුමනින්ම අහිමිවනු ඇත.

(එක් කරුණකට 1 බැගින් ල. 04)

IV. කතිපයාධිකාරය ඒකාධිකාරී තරගයෙන් වෙනස් වන්නේ කෙසේද?

- කතිපයාධිකාරය තුළ ආයතන දෙකක් හෝ ඉතා ස්වල්පයක් තිබෙන නමුත් ඒකාධිකාරී තරගය තුළ ආයතන විශාල ප්‍රමාණයක් පැවතීම.
- කතිපයාධිකාරය තුළ ආයතන සමජාතිය භාණ්ඩයක් හෝ ඉතා ආසන්න ආදේශකයක් නිපදවන නමුත් ඒකාධිකාරී තරගය තුළ ප්‍රභේදිත භාණ්ඩයක් නිපදවීම.
- කතිපයාධිකාරයට ප්‍රවේශ වීම ඉතා දුෂ්කර නමුත් ඒකාධිකාරී තරඟයට ප්‍රවේශ වීමේ බාධක නොපැවතීම.
- කතිපයාධිකාරය තුළ ආයතන අතර දැඩි අන්‍යෝන්‍ය අන්තර් රැඳියාවක් ඇති නමුත් ඒකාධිකාරී තරඟයේ ආයතන අතර අන්‍යෝන්‍ය රැඳියාවක් නොමැතිවීම.
- කතිපයාධිකාරයේ ආයතන අතර මිල දැඩියාවක් පවතින නමුත් ඒකාධිකාරී තරගයේ ආයතන අතර ස්වාධීන මිල තීරණය කිරීමේ හැකියාවක් පැවතීම.

(වෙනස්කම් 4ට ල. 04)

V. ශ්‍රී ලංකාවේ ඇති පහත සඳහන් කර්මාන්ත වඩාත්ම ආසන්න වන්නේ කුමන වෙළඳපොළ ව්‍යුහයටද?

(අ) බෝංචි - පූර්ණ තරගය

(ආ) රූපලාවන්‍ය සේවා - ඒකාධිකාරී තරගය

(ඉ) සිසිල් බීම - කතිපයාධිකාරය

(ඊ) රැහැන් දුරකථන සේවා - ඒකාධිකාරය

(ල. 01×04=04)



CamScanner

05) ආර්ථිකයකට අදාළව 2024 වර්ෂය සඳහා ජාතික ගිණුම් සංඛ්‍යා දත්ත කීපයක් පහත දැක්වේ සියලු අගයන් රුපියල් බිලියනවලින්ය.

- කෘෂි අංශයේ දළ එකතු කළ වටිනාකම = 1600
- දළ මිශ්‍ර ආදායම = 4000
- පෞද්ගලික පාරිභෝජනය = 12000
- විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම = 2800
- සේවක ආදායම් = 5000
- සේවා අංශයේ දළ එකතු කළ වටිනාකම =10000
- නිෂ්පාදිතය මතබදු- එම සහනාධාර = 2400
- අපනයන = 5000
- ආනයන = 7000
- නිෂ්පාදනය මත වෙනත් බදු -එම සහනාධාර = 600
- කාර්මික අංශයේ දළ එකතු කල වටිනාකම = 8000
- දළ මෙහෙයුම් අතිරික්තය = 10000
- දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය = 5600
- රජයේ මිලදී ගැනීම් = 6400
- විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම = -800
- ස්ථාවර ප්‍රාග්ධන පාරිභෝජනය = 4000

I. පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) ආදායම් ක්‍රමයට දළ ජාතික ආදායම

| | |
|---|---|
| සේවක ආදායම් | = 5000 |
| දළ මෙහෙයුම් අතිරික්තය | = 10000 |
| දළ මිශ්‍ර ආදායම | = 4000 |
| නිෂ්පාදනය මත වෙනත් බදු -එම සහනාධාර | = 600 |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | = -800 |
| දළ ජාතික ආදායම | = 21200 |

(ල. 2)

(ආ) වියදම් ක්‍රමයට දළ ජාතික ආදායම

| | |
|---|---|
| පෞද්ගලික පාරිභෝජනය | = 12000 |
| රජයේ මිලදී ගැනීම් | = 6400 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | = 5600 |
| ශුද්ධ අපනයන | = -2000 |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | = -800 |
| | = 21200 |

(ල. 2)

(ඉ) නිමැවුම් ක්‍රමයට දළ ජාතික ආදායම

| | |
|---|---|
| කෘෂි අංශයේ දළ එකතු කළ වටිනාකම | = 1600 |
| කාර්මික අංශයේ දළ එකතු කල වටිනාකම | = 8000 |
| සේවා අංශයේ දළ එකතු කළ වටිනාකම | =10000 |
| නිෂ්පාදිතය මත වෙනත් බදු -එම සහනාධාර | = 2400 |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | = -800 |
| | = 21200 |

(ල. 2)



CamScanner

(ඊ) වැයකළ හැකි දළ ජාතික ආදායම

වැය කළ හැකි දළජාතික ආදායම = දළ ජාතික ආදායම + විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම
= 21200 + 2800
= <u>24000</u> (ල. 2)

(උ) දේශීය ඉතුරුම්

දේශීය ඉතුරුම් = දළ දේශීය නිෂ්පාදිතය - මුළු පරිභෝජණය
= 22000 – (6400 + 12000)
= <u>3600</u>

හෝ

දේශීය ඉතුරුම් = දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය + ශුද්ධ අපනයනය
= 5600 + (5000 – 7000)
= <u>3600</u> (ල. 2)

(ඌ) ජාතික ඉතුරුම්

ජාතික ඉතුරුම් = වැයකළ හැකි දළ ජාතික ආදායම - (මුළු පරිභෝජණය)
= 24000 – 18400
= <u>5600</u>

හෝ

ජාතික ඉතුරුම් = දේශීය ඉතුරුම් + විදේශීය ඉතුරුම්
= 3600 + (-800 + 2800)
= <u>5600</u> (ල. 2)

II. ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය; C=1800+0.8yd යැයි උපකල්පනය කරන්න.

(අ) රජය රාජ්‍ය වියදම සහ ස්ථාවර බදු රුපියල් බිලියන 100 බැගින් එක්වර ඉහළ දැමුවහොත් සමතුලිත ජාතික ආදායමට සිදුවන බලපෑම පැහැදිලි කරන්න.

$\Delta Y = (K_E \times \Delta G) + (K_T \times \Delta T)$ (ල. 1)

$= \left(\frac{1}{1-MPC} \times 100\right) + \left(\frac{-MPC}{1-MPC} \times 100\right)$ (ල. 1)

$= (5 \times 100) + (-4 \times 100)$ (ල. 1)

$= 500 - 400$

$\Delta Y = 100$ (ල. 1)

ජාතික ආදායම රු. බි. 100කින් ඉහළ යයි.

(ආ) මෙම ආර්ථිකයේ ස්වාධීන ආයෝජනය රුපියල් බිලියන 75 කින් ඉහළ ගියහොත් පාරිභෝජන වියදමට සිදුවන බලපෑම ගණනය කරන්න.

$\Delta C = MPC \times \Delta Y$ ; $\Delta Y = K_E \times \Delta I$

$\Delta C = 0.8 \times 375$ $\quad \Delta Y = 5 \times 75$

$= \underline{300}$ $\quad = \underline{375}$

රු. බි. 300කින් පරිභෝජණය ඉහළ යයි.

(ල. 02)



CamScanner

(ඉ) මෙම ආර්ථිකයේ ශුද්ධ බදු ;Tn= රු.බි.1000ක්ද ,ශුද්ධ අපනයන ශූන්‍ය අගයක් නම් ජාතික ආදායම මට්ටම රුපියල් බිලියන 10,000දී සාමාන්‍ය ඉතුරුම් නැඹියාව ගණනය කරන්න.

$APC = \frac{C}{Y_d}$  $Y_d = Y - T_n$

$= 10000 - 1000$

$= 9000$

$APC = \frac{9000}{9000}$

$= \underline{1}$

$C = 1800 + 0.8(9000)$

$= 1800 + 7200$

$= \underline{9000}$

($Y_d$ හා C සෙවීමට ල. 1 යි. APC ගණනයට ල. 1 යි)

"ආ" උපකොටස

මෙම කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරාගන්න.

06)

I. (අ) M2b පුළුල් මුදල් සැපයුමට ඇතුළත් වන මහජනයා සතු වත්කම් කවරේ ද?

- මහජනයා සතු ව්‍යවහාර මුදල්
- මහජනයා සතු වාණිජ බැංකු වෙතැති ඉල්ලුම් තැන්පතු
- මහජනයා සතු වාණිජ බැංකු වෙතැති කාලීන සහ ඉතුරුම් තැන්පතු
- ගලපන ලද විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු

(වත්කම් 4ම දන්නා අවස්ථාවේ පමණක් ල.3)

(ආ) M2b මුදල් සැපයුම ඉහළ යාමට තුඩුදෙන සාධක කවරේද?

- මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් ඉහළ යාම
- වාණිජ බැංකුවල ශුද්ධ විදේශ වත්කම් ඉහළ යාම
- මහ බැංකුව රජයට ලබාදෙන ණය ඉහළ යාම
- වාණිජ බැංකු රජයට ලබාදෙන ණය ඉහළ යාම
- වාණිජ බැංකු පෞද්ගලික අංශයට ලබා දෙන ණය ඉහළ යාම
- වාණිජ බැංකු රාජ්‍ය සංස්ථාවලට ලබාදෙන ණය ඉහළ යාම

(කරුණු 3කට ල. 03)



CS CamScanner

II. MV=PY විනිමය සමීකරණය මුදල් ප්‍රමාණවාදී විග්‍රහයට සම්බන්ධ වන ආකාරය විමසන්න.

- අනෙකුත් සාධක නොවෙනස්ව පවතී නම් මුදල් සැපයුම සහ මිල මට්ටම අතර ඍජු සහ සමානුපාතික සම්බන්ධතාවක් පවතින බව මුදල් ප්‍රමාණවාදී න්‍යායෙන් කියවේ. එම විග්‍රහයට අනුව මුදල් සැපයුම ඉහළ යන විට එම ප්‍රතිශතයෙන්ම මිල මට්ටමද ඉහළ යයි. මීට අමතරව උද්ධමනයට එකම හේතුව වන්නේද මුදල් සැපයුම ඉහළ යාම පමණයි.
- MV = PY සමීකරයෙන් කියවෙන්නේ මුදල් සැපයුම සංසරණ ප්‍රවේගයෙන් ගුණ කළ විට ලැබෙන අගයට මිල මට්ටම මූර්ත නිමැවුමෙන් ගුණ කළ විට ලැබෙන බවය.
- මුදල් ප්‍රමාණවාදය සහ විනිමය සමීකරණය අතර සම්බන්ධතාව හටගන්නේ එය ඉදිරිපත් කළ අයගේ උපකල්පනය මතය. මුදල් ප්‍රමාණවාදීන් කෙටි කාලයේදී ආර්ථිකයක සංසරණ ප්‍රවේගය සහ මූර්ත නිමැවුම නොවෙනස්ව පවතී යයි උපකල්පනය කළ නිසා මුදල් සැපයුම සහ මිල මට්ටම අතර සමානුපාතික සම්බන්ධතාවක් නිර්මාණය වෙයි.
- V සහ Y ස්ථාවරව පවතින විට සමීකරණය තුලනය වීම සඳහා මුදල් සැපයුම ඉහළ ගියොත් ඊට සමාන ප්‍රතිශතයකින් මිල මට්ටමද ඉහළ යා යුතුය. එවිට මුදල් සැපයුමේ වර්ධන අනුපාතයට සමානව උද්ධමනයක් නිර්මාණය වේ.

(කරුණු 4කට ල. 04)

III. ඉල්ලුම් උද්ධමනය පාලනය කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය භාවිත කරන ආකාරය පැහැදිලි කරන්න.

- සමාහාර ඉල්ලුම ඉහළ යාම නිසා පොදු මිල මට්ටමේ සිදුවන වර්ධනය ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය ලෙස සැලකේ.
- ඉල්ලුම් උද්ධමනය පාලනය කිරීම සඳහා සමාහාර ඉල්ලුම කළමනාකරණයට මූල්‍ය ප්‍රතිපත්තිය හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යොදා ගනී.
- මූල්‍ය ප්‍රතිපත්තිය යටතේ මහ බැංකුවට මුදල් සැපයුම අඩු කිරීමෙන් හෝ පොලී අනුපාත ඉහල නැංවීම තුළින් සමාහාර ඉල්ලුම ඉහළ යාම පාලනය කළ හැක.
- රාජ්‍ය අයවැය තුළින් රාජ්‍ය වියදම් කපා හැරීම සහ ඍජුබදු ඉහල නැංවීම මගින් සමාහාර ඉල්ලුම අඩු කිරීම හෝ ඉහළ යාම පාලනය කිරීම මගින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ඔස්සේ උද්ධමනය පාලනය කළ හැක.

(පලමු කරුණු 2ට ලකුණු 1 ක්ද, අවසන් කරුනු 2කට ලකුණු 3ක්ද ලබා දෙන්න.)

IV. ශ්‍රී ලංකා මහ බැංකුව වාණිජ බැංකු පද්ධතියේ ණය සැපයුම සීමා කිරීම සඳහා ප්‍රතිපත්ති උපකරණ භාවිත කරන ආකාරය සාකච්ඡා කරන්න.

- මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ බලධාරියා හැටියට ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථිකයේ මුදල් සැපයුම පාලනය කිරීමට වාණිජ බැංකු පද්ධතිය සපයන ණය ප්‍රමාණය හසුරවනු ලබයි.

(ල. 1)

- වාණිජ බැංකු මහජනතාවට සපයන ණය ප්‍රමාණය සීමා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රමාණාත්මක ණය පාලන උපකරණ තුනක් භාවිත කරයි. කරයි ඒවා නම් බැංකු අනුපාතිකය, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය සහ විවෘත වෙළඳපොළ කටයුතු යන ඒවාය.

(ල. 1)



CamScanner

- වාණිජ බැංකු සපයන ණය ප්‍රමාණය සීමා කිරීම සඳහා මහ බැංකුවට පහත දැක්වෙන ආකාරයට ඉහත ප්‍රතිපත්ති උපකරණ යොදා ගත හැකිය.
    - බැංකු අනුපාතිකය ඉහල නැංවීම.
    - ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය ඉහළ දැමීම
    - වාණිජ බැංකු වෙත භාණ්ඩාගාර බිල්පත් විකිණීම
    - වාණිජ බැංකු වෙතින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම නැවැත්වීම

(ල. 4)

07)


I. "නිෂ්පාදනයේ සෘණ බාහිරතා පවතින විට සම්පත් බෙදී යාම අකාර්යක්ෂම වේ "මෙම ප්‍රකාශය රූපසටහනක් භාවිතයෙන් පැහැදිලි කරන්න.

- සම්පත් බෙදී යාම කාර්යක්ෂම වීම සඳහා ආන්තික සමාජ පිරිවැය ආන්තික සමාජ ප්‍රතිලාභයට සමාන වෙන නිමැවුම් මට්ටමක් නිපදවීම / පරිභෝජනය කළ යුතුය. MSC සහ MSB අසමාන වෙන සෑම නිමැවුම මට්ටමකදීම සමාජ සුභසාධනයට හානියක් සිදුවන නිසා එවැනි නිමැවුම් මට්ටමක් නිපදවීම / පරිභෝජනය සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතාවක් නිර්මාණය කරයි. නිෂ්පාදනයේ සෘණ බාහිරතාවක් පවතින විටද අධි නිෂ්පාදනයක් වීම නිසා සම්පත් බෙදී යාම අකාර්යක්ෂම වේ. පහත රූප සටහනේ එවැනි අවස්ථාවක් පෙන්වයි.

(ල. 1)

- රූපයට අනුව ඉල්ලුම් වක්‍රය සහ සැපයුම් වක්‍රය ඡේදනය වෙන a ලක්ෂයේ දී වෙළඳපොළ සමතුලිත වී Q ප්‍රමාණය හුවමාරුවේ. නමුත් එහිදී සෘණ බාහිරතාව නිසා ආන්තික සමාජ ප්‍රතිලාභයට වඩා ආන්තික සමාජ පිරිවැය ඉහළ අගයක් ගනී. සම්පත් බෙදීයාම කාර්යක්ෂම වන්නේ MSC = MSB වන $Q_1$ නිමැවුම් මට්ටමේදීය. නමුත් වෙළඳපොළ තුළින් හුවමාරු වන්නේ $Q_0$ නිසා abc ත්‍රිකෝණයට සමානව සුභසාධනය අහිමි වීමක් සිදුවේ.

(ල. 1)




MPC = ආන්තික පෞද්ගලික පිරිවැය
MEC = ආන්තික බාහිර පිරිවැය
MSC = ආන්තික සමාජ පිරිවැය
MSB = ආන්තික සමාජ ප්‍රතිලාභය

(නිවැරදි රූප සටහනට ල. 2)



CamScanner

II. (අ) බදු මූලධර්ම නම් කරන්න.

බදු මූලධර්ම

- සාධාරණත්වය
  - ගෙවීමේ හැකියා මූලධර්මය
  - ප්‍රතිලාභ මූලධර්මය
- කාර්යක්ෂමතාව / මධ්‍යස්ථ බව
- නිශ්චිත බව
- පිරිමැසුම් සහිත බව
- සරල බව
- නම්‍යශීලි බව
- අනුකූල බව

(කරුණු 3කට ල. 3)

(ආ) බදු අය කිරීමේ "සාධාරණත්වය" යන්නෙන් කුමක් අදහස් කරනු ලබයිද? පැහැදිලි කරන්න.

- බදු අය කිරීමේ සාධාරණත්වය පැහැදිලි කිරීමට මූලධර්ම දෙකක් ගොඩනැගී තිබේ. එනම් ගෙවීමේ හැකියා මූලධර්මය සහ ප්‍රතිලාභ මූලධර්මයයි.
- ගෙවීමේ හැකියාව පදනම් කරගෙන පුද්ගලයින්ගෙන් බදු අය කිරීම ගෙවීමේ හැකියා මූලධර්මයට අයත් වේ. එය ඉටුවීම සඳහා බදු ක්‍රමය තිරස්ව මෙන්ම සිරස්ව ද සාධාරණ විය යුතුය.
- සමාන ආර්ථික ශක්තියක් (සමාන ආදායම් උපයන්නන්) ඇති අයගෙන් සමාන මුදලක් බදු අය කළ යුතු බව තිරස් සාධාරණත්වයෙන් අදහස් කෙරේ. එමෙන්ම රජය බදු අය කිරීමේදී එකිනෙකට වෙනස් ආදායම් උපයන පුද්ගලයින්ගෙන් ආදායම් මට්ටම් ඉහළ යන විට බදු අනුපාතය ඉහළ යන ආකාරයට බදු ක්‍රමය සැකසිය යුතු බව සිරස් සාධාරණත්වය ලෙස සැලකේ.
- රජය සපයන සේවාවන්ගෙන් ඒ ඒ පුද්ගලයා ලබන ප්‍රතිලාභයට සමානුපාතිකව බදු අය කළ යුතුයැයි ප්‍රතිලාභ මූලධර්මයෙන් කියැවේ.

(කරුණු 3කට ල. 3)

III. වර්තමානයේදී ශ්‍රී ලංකා රජයේ අයභාරය තුළ ප්‍රධාන බදු මූලාශ්‍ර දෙකක් හා බදු නොවන මූලාශ්‍ර දෙකක් දක්වන්න.

- ප්‍රධාන බදු මූලාශ්‍ර
  - ආදායම් බදු
  - එකතු කළ අගය මත බදු
  - නිෂ්පාදන බදු
  - ආනයන මත බදු

(මූලාශ්‍ර 2කට ල. 2)

- බදු නොවන මූලාශ්‍ර
  - ගාස්තු සහ අය කිරීම්
  - ලාභ සහ ලාභාංශ
  - පොලී
  - බදු කුලී ආදායම්

(මූලාශ්‍ර 2කට ල. 2)



CamScanner

IV. (අ) රාජ්‍ය අයවැය හිඟය පියවීමේ ප්‍රධාන මූලාශ්‍ර කවරේද?

රාජ්‍ය අයවැය හිඟය පියවීමේ මූලාශ්‍ර

- විදේශ ණය

(ල. 1)

- දේශීය වෙළඳපොළ ණය
  - බැංකු අංශය (මහ බැංකුව හා වාණිජ බැංකු)

(ල. 1)

  - බැංකු නොවන වෙළඳපොළ ණය

(ල. 1)

(ආ) බැංකු සහ බැංකු නොවන මූලාශ්‍ර භාවිතයෙන් අයවැය හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රතිවිපාක සාකච්ඡා කරන්න.

- මහ බැංකුව සහ වාණිජ බැංකු ඇතුළත් බැංකු මූලාශ්‍රයෙන් ණය ලබාගෙන අයවැය හිඟය පියවීමේදී මුදල් සැපයුම ඉහළ යන නිසා මෙය ප්‍රසාරණාත්මක මූලාශ්‍රයක් ලෙස සැලකේ. මෙම අංශයෙන් ණය ගැනීමේ ප්‍රතිඵලයක් හැටියට මුදල් සැපයුම ඉහළ ගොස් උද්ධමනකාරී තත්ත්වයක් ඇති විය හැක.
- දේශීය වෙළඳපොලේ බැංකු නොවන මූලාශ්‍රව වලින් ණය ලබා ගැනීමේදී මුදල් සැපයුමට බලපෑමක් නොවුනද පොලී අනුපාත ඉහළ යෑම නිසා පෞද්ගලික ආයෝජන අඩුවී ජාතික ආදායම සහ සේවා නියුක්තිය පහළ වැටීමක් සිදුවේ.

(එක් කරුණකට ලකුණු 1කි. කරුණු 2කට ල. 3)

08)

I. (අ) විදේශ වෙළෙඳාමට සහභාගී වීමෙන් රටකට ලැබෙන ප්‍රතිලාභ කවරේද?

විදේශ වෙළඳාමට සහභාගී වීමෙන් රටකට ලැබෙන වාසි

- දේශීයව නිපදවිය නොහැකි භාණ්ඩ හා සේවා මිලට ගත හැකිවීම
- ඉහළ ආවස්ථික පිරිවැයක් යටතේ නිපදවිය යුතු භාණ්ඩ අඩු අවස්ථික පිරිවැයකට ආනයනය කළ හැකිවීම.
- ඉහළ ගුණත්වයක් සහිත නිෂ්පාදිත ලබා ගත හැකි වීම
- දේශීය නිෂ්පාදන හැකියාවක්රයෙන් පිටත භාණ්ඩ සංයෝගයක් පරිභෝජනය කළ හැකිවීම
- ආර්ථික වෘද්ධිය වේගවත් වීම
- දියුණු තාක්ෂණය ලබාගත හැකිවීම
- ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය වීම
- දේශීය නිෂ්පාදකයාට පුළුල් වෙළඳපොළක් හිමිවීම

(ඕනෑම කරුණු 3කට ල. 3)

(ආ) විදේශ වෙළඳාමේ නිරපේක්ෂ වාසිය සහ සාපේක්ෂ වාසිය අතර වෙනස කුමක්ද?

- යම් රටකට තවත් රටකට වඩා අඩු සම්පත් ප්‍රමාණයකින් හෝ වැඩි ඵලදායිතාවකින් භාණ්ඩයක් නිපදවීමට හැකිවීම නිරපේක්ෂ වාසියයි.

(ල. 1)

- යම් රටකට තවත් රටකට වඩා අඩු අවස්ථික පිරිවැයක් යටතේ භාණ්ඩයක් නිපදවීමට හැකිවීම සාපේක්ෂවාසියයි.

(ල. 1)



CamScanner

(ඉ) සාපේක්ෂ වාසි හට ගැනීමට හේතු කවරේද?

සාපේක්ෂ වාසි හට ගැනීමට හේතු

- රටවල් අතර සම්පත් උරුමයේ වෙනස්කම් පැවතීම
- රටවල් අතර සම්පත්වල ගුණාත්මක වෙනස්කම් පැවතීම
- පරිමාණානුකූල පිරිමැසුම් සහිත කර්මාන්ත පැවතීම
- රටවල් අතර තාක්ෂණයේ වෙනස්කම් පැවතීම
- භාණ්ඩ ප්‍රභේදනය කිරීම
- රටවල් අතර උද්ධමනයේ වෙනස්කම් පැවතීම
- යම් රටක පිහිටීමේ වාසිය (ස්ථානීය පිහිටීම)
- රාජ්‍ය ප්‍රතිපත්ති

(ඕනෑම වාසි 3කට ල. 3)

II. සඵල ආරක්ෂණ අනුපාතිකය (ERP) යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද එහි අගය අඩුවීමට බලපාන සාධක කවරේද?

- ආනයනික නිමි භාණ්ඩයක් සඳහා තීරු බද්දක් පැනවීම හේතු කොටගෙන දේශීය නිෂ්පාදකයාගේ එකතු කළ වටිනාකමේ සිදුවන ප්‍රතිශතක ඉහළ යාම සඵල ආරක්ෂණ අනුපාතිකයයි.

(ල.1)

- සඵල ආරක්ෂණ අනුපාතිකය අඩුවීමට හේතු
  - ආනයනික නිමි භාණ්ඩය මත තීරුබදු අඩු කිරීම
  - ආනයනික යෙදවුම් මත තීරු බදු ඉහළ නැංවීම
  - නිමි භාණ්ඩයක් මිලෙන් එහි එකතු කළ වටිනාකමට අයත් ප්‍රතිශතය විශාල වීම

(කරුණු 3කට ල. 3)

III. වර්තමානයේදී ගෙවුම් ශේෂ ලේඛනයේ සමස්ත ශේෂය ලබා ගන්නේ කෙසේද?

ගෙවුම් ශේෂ ලේඛනයේ සමස්ත ශේෂය ලබාගන්නා ආකාරය

- රජය සහ මහබැංකුව සතු විදේශ වත්කම් දළ නිල සංචිත වත්කම් ලෙස සැලකේ.
- දළ නිල සංචිත වත්කම්වලින් ඊට අදාල වගකීම් අඩු කළ විට එම වර්ෂයේ ශුද්ධ ජාත්‍යන්තර සංචිතය ලැබේ.
- යම් වර්ෂයකදී ශුද්ධ ජාත්‍යන්තර සංචිතයේ වෙනස්වීම ගෙවුම් ශේෂයේ සමස්ත ශේෂය ලෙස සැලකෙයි
- ශුද්ධ ජාත්‍යන්තර සංචිතය ඉහළ ගියහොත් සමස්ථ ශේෂයේ අතිරික්තයක් හටගන්නා අතර ශුද්ධ ජාත්‍යන්තර සංචිතය පහළ වැටුණහොත් සමස්ත ශේෂයේ හිඟයක් ඇතිවේ.

(කරුණු 4කට ල. 4)

IV. පාවෙන විනිමය අනුපාතය අධිප්‍රමාණ (appreciate) වීමට හේතුවන සාධක කවරේද?

පාවෙන විනිමය අනුපාතය අධිප්‍රාමාණ වීමට (ඉහළ යාමට) හේතු

- අපනයන වැඩිවීම
- ආනයන අඩුවීම
- සංචාරක පැමිණීම ඉහළ යාම
- විදේශ ආයෝජන ගලා ඒම
- විදේශ ණය ලබාගැනීම
- සේවා නියුක්ති ප්‍රේෂණ ගලා ඒම
- දේශීය මිල ස්ථායිකරණය වීම
- දේශීය පොලී අනුපාත ඉහළ යාම
- දේශපාලන ස්ථාවර බව ඇතිවීම


(ඕනෑම කරුණු 4කට ල. 4)

09)


I. ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී ආර්ථික වෘද්ධියට අමතරව ආර්ථිකයේ ව්‍යුහමය වෙනස්කම් සිදුවේ.
(අ) ආර්ථික වෘද්ධිය රූප සටහනක් මගින් පැහැදිලි කරන්න.

ආර්ථිකයක විභව නිමවුම (භව්‍ය නිමැවුම / පූර්ණ සේවා නියුක්ති නිමැවුම) දිගු කාලයක් තිස්සේ ඉහල යාම න්‍යායාත්මකව ආර්ථික වෘද්ධිය ලෙස සැලකේ.

(ල. 1)




(a)




(b)

- ආර්ථික වෘද්ධියේදී නිෂ්පාදන හැකියා වක්‍රය පිටතට විතැන් වන අතර දිගු කාලීන සමාහාර සැපයුම් වක්‍රය දකුණට විතැන්වේ. එමගින් ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාව ඉහළ යයි.

(ල. 1)

(ඕනෑම රූප සටහනකට ල. 1)

(ආ) ආර්ථික වෘද්ධියත් සමග සිදුවන ව්‍යුහමය වෙනස්කම් කවරේද?


වෘද්ධිය සමග ඇතිවන ව්‍යුහමය වෙනස්කම්

- කාර්මීකරණය ; කාර්මික අංශයේ සාපේක්ෂ විශාලත්වය වැඩිවීම
- කෘෂි අංශය සාපේක්ෂසංකෝචනය වීම
- සේවා අංශය ප්‍රධානම අංශය බවට පත්වීම
- නවීකරණය
- වෙළඳ රටාව වෙනස්වීම;අපනයන සංයුතිය තුළ කෘෂි භාණ්ඩ සංකෝචනය වී කාර්මික භාණ්ඩ වැදගත් වීම
- සේවා නියුක්ති මූලාග්‍ර වෙනස් වී කෘෂි අංශයේ ශ්‍රම බලකාය සාපේක්ෂව කුඩා වී කර්මාන්ත හා සේවා අංශවලට මාරුවීම
- සාධක ඵලදායිතාව ඉහළ යාම
- නාගරීකරණය
- ජනසංඛ්‍යා වර්ධනය පහළ වැටීම

(ඕනෑම වෙනස්වීම් 3කට ල. 3)

II. ප්‍රජා විද්‍යා සංක්‍රාන්තිය තුළ දළ උපත් අනුපාතය සහ දළ මරණ අනුපාතය හැසිරෙන ආකාරය පැහැදිලි කරන්න.

- ප්‍රජා විද්‍යා සංක්‍රාන්තිය තුළ රටක් මුහුණ දෙන අවධි හතරක් තිබේ. ඒ ඒ අවධි වලදී දළ උපත් අනුපාතය සහ දළ මරණ අනුපාතය හැසිරෙන ආකාරය පහත රූප සටහන ඇසුරෙන් හඳුනාගත හැක.




- පළමු අවධියේදී දළ උපත් අනුපාතිකය සහ දළ මරණ අනුපාතිකය යන දෙකම ඉතා ඉහළ මට්ටමක පවතින බැවින් ස්වාභාවික වර්ධන අනුපාතය ඉතා පහළ මට්ටමක පවතී.
- දෙවන අවධියේදී දළ උපත් අනුපාතිකය ඉහළ මට්ටමක පවතිද්දී දළ මරණානුපාතිකය සීඝ්‍රයෙන් පහළ වැටීම නිසා ස්වාභාවික වර්ධන අනුපාතිකය ඉතා ඉහළ අගයක් ගනියි.
- තෙවන අවධියේදී දල උපත් අනුපාතිකය ද දළ මරණ අනුපාතිකයට වඩා වේගයෙන් පහළ වැටීම නිසා ස්වභාවික වර්ධන අනුපාතිකය ක්‍රමක්‍රමයෙන් ඉතා ඉහළ අගයක සිට පහළට ගමන් කරයි.
- හතරවන අවධියේදී දල උපත් අනුපාතිකය හා දළ මරණ අනුපාතිකය යන දෙකම ඉතා පහළ මට්ටමක ස්ථාවර වීම නිසා ස්වාභාවික වර්ධන අනුපාතිකය ශුන්‍යයට ආසන්න වේ.

(කරුණු 4කට ල. 4)

III. (අ) ජාතික දරිද්‍රතා රේඛාව යනු කුමක්ද?

දිනකට කිලෝ කැලරි කැලරි 2030ක පෝෂණයක් සහ අවම ආහාර නොවන අවශ්‍යතා ඉටුකර ගැනීමට පුද්ගලයකුට මාසයකට වියදම් වන මුදල් ප්‍රමාණය ජාතික දරිද්‍රතා රේඛාව ලෙස සැලකේ. එම වියදමට වඩා අඩු ආදායම් උපයන්නන් නිරපේක්ෂ දුප්පතුන් ලෙස සැලකේ.

(ල. 02)

(ආ) දරිද්‍රතාව අඩු කිරීමට යෝග්‍ය ප්‍රතිපත්ති කවරේද?

දරිද්‍රතාව අඩු කිරීමට යෝග්‍ය ප්‍රතිපත්ති

- සේවා වියුක්තිය අඩුකර පූර්ණ සේවා නියුක්තිය ඇති කිරීම
- අවම කම්කරු වැටුප් නියම කිරීම
- දුප්පත් ජනයා සඳහා නිවාස ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- වයස්ගත ජනයා සඳහා සමාජ ආරක්ෂණ වැඩසටහන් හඳුන්වා දීම
- දුප්පත් ජනතාවට එයින් මිදෙන තෙක් සහනාධාර සැපයීම
- ළදරුවන් හා ළමයින් සඳහා පෝෂණ හා සෞඛ්‍ය පහසුකම් සැපයීම
- අධ්‍යාපනය හා කුසලතා වර්ධනයට සහාය දීම
- අනුක්‍රමික ආදායම් බදු පැනවීම
- සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- සුභසාධන දීමනා ඉහල නැංවීම
- ආර්ථික වෘද්ධිය දුප්පතුන්ට හිතකර වන ආකාරයට ක්‍රියාත්මක කිරීම

(ඕනෑම කරුණු 4කට ල. 4)

IV. "ශ්‍රී ලංකාවේ පුරුෂ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකයට වඩා ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය ඉතා පහළ අගයක් ගනී "මෙයට බලපා ඇති සාධක නම් කරන්න.

ශ්‍රී ලංකාවේ පුරුෂ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකයට සාපේක්ෂ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය ඉතා පහළ අගයක් ගැනීමට හේතු

- පෞද්ගලික හා නොවිධිමත් අංශවල ස්ත්‍රීන් සඳහා පහළ වැටුප් මට්ටම් ක්‍රියාත්මක වීම
- කාන්තාවන්ට නිවසින් බැහැරව දීර්ඝ කාලයක් ගත කිරීමට අපහසු වීම
- දරුවන් හා වයස්ගත දෙමව්පියන් රැකබලා ගැනීමට සිදුවීම
- කාන්තාවට නිවසේ හා සමාජයේ වගකීම් පවරා පුරුෂයින් එයින් ඉවත්වීම
- කාන්තාවන්ට නිශ්චිත කාල සටහනකට අනුව වැඩ කිරීමට නොහැකි වන පරිදි පවුලේ වගකීම් පැවරීම
- කාන්තාවන් ලිංගික හා වෙනත් ආකාරයේ හිංසනයන්ට ලක් වීම
- අනාරක්ෂිත බව
- සමාජ ආකල්ප රැකියාවේ යෙදීමට එරෙහිව පැවතීම
- රැකියා පරිසරය අයහපත් වීම

(ඕනෑම කරුණු 4කට ල. 4)

10)

I. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කළ ප්‍රධාන සමාජ ආරක්ෂණ වැඩසටහන් කවරේද?

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කළ සමාජ ආරක්ෂණ වැඩසටහන්

- සහල් සලාකය
- ආහාර මුද්දර
- ජනසවිය
- සමෘද්ධිය
- දිවිනැගුම
- අස්වැසුම
- විශ්‍රාම වැටුප
- සේවක අර්ථසාධක අරමුදල
- ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනා
- ත්‍රිපෝෂ
- වකුගඩු රෝගීන් සඳහා දීමනා
- අග්‍රහාර රක්ෂණ ක්‍රමය
- පෝෂණ මල්ල
- සුරක්ෂා රක්ෂණ ක්‍රමය
- එන්නත්කරණය
- ශිෂ්‍යත්ව ආධාර
- නොමිලේ සෞඛ්‍ය සේවා
- නිදහස් අධ්‍යාපනය
- පාසල් ළමුන් සඳහා දිවා ආහාර
- පාසල් නිල ඇඳුම් රෙදි බෙදා දීම
- පාසල් පෙළපොත් නොමිලේ සැපයීම
- පාසල් සිසුන්ට වාරප්‍රවේශ පත්‍ර
- ආබාධිත පුරවැසියන් සඳහා දීමනා
- ඉඩම් බෙදා දීම
- නිවාස දස ලක්ෂයේ වැඩසටහන

(ඕනෑම වැඩසටහන් 5කට ල. 5)

II. 1977 දී සිදුකළ මෙරට ප්‍රධාන ආර්ථික ප්‍රතිසංස්කරණ කවරේද?

1977 දී සිදුකළ ප්‍රධාන ආර්ථික ප්‍රතිසංස්කරණ

- ආනයන මත පනවා තිබූ දැඩි සීමා ඉවත් කර විදේශ වෙළඳාම නිදහස් කිරීම
- ස්ථාවර විනිමය අනුපාත ක්‍රමය වෙනුවට පාලිත පාවෙන (පාලිත නම්‍ය) විනිමය අනුපාත ක්‍රමය හඳුන්වා දීම
- ආනයන ආදේශන කාර්මීකරණ ප්‍රතිපත්තිය ඉවත්කර අපනයනාභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය හඳුන්වාදීම
- කර්මාන්තවල ආයෝජන සඳහා දේශීය සහ විදේශීය පෞද්ගලික අංශවලට ඉඩකඩ විවෘත කිරීම
- සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය සඳහා ප්‍රමුඛතාව ලබාදීම
- රජයේ යටතේ පැවති ඒකාධිකාරී කර්මාන්ත පෞද්ගලික අංශයට විවෘත කිරීම
- රජය මහා පරිමාණ යටිතල පහසුකම් සැපයීමට ආයෝජනය කිරීම



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! mScanner

- කුටුම්භ සහනාධාර තෝරාගත් අඩු ආදායම්ලාභී ජනතාවට පමණක් ලබාදීම
- මූල්‍ය ක්ෂේත්‍රයට පිවිසීමේ සීමා ඉවත් කිරීම
- ආහාර මුද්දර ක්‍රමය හඳුන්වාදීම

(ඕනෑම කරුණු 5කට ල. 5)

III. වර්තමාන ශ්‍රී ලංකාව මුහුණ දී ඇති විදේශ විනිමය අර්බුධයට විසඳුම් ඉදිරිපත් කරන්න.

වර්තමානයේදී ශ්‍රී ලංකාව මුහුණ දී ඇති විදේශ විනිමය අර්බුදයට විසඳුම්

- ණය ප්‍රතිව්‍යුහගත කිරීම
- සහන කාල සීමාවක් යටතේ අඩු පොළියට විදේශ ණය ලබා ගැනීම
- සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම
- විදේශගත ශ්‍රමිකයින්ගේ සේවා නියුක්ති ප්‍රේෂණ ඉහල නංවා ගැනීම
- අපනයන විවිධාංගිකරණය මගින් අපනයන ආදායම් ඉහළ නැංවීම
- ආනයන ආදේශන නිපදවීම මගින් ආනයන වියදම් අඩුකර ගැනීම
- සංචාරක කර්මාන්තය දියුණු කිරීම
- දේශීය මිල මට්ටම ස්ථායිකරණය
- ආර්ථික හා දේශපාලන ස්ථායිතාව ඇති කිරීම
- රාජ්‍ය අංශයේ දූෂණය හා වංචාව අඩුකිරීම
- විනිමය අනුපාතිකය අවප්‍රමාණ කිරීම
- තෝරා ගත් ආනයන තහනම් කිරීම

(ඕනෑම කරුණු 5කට ල. 5)

IV. මැද පෙරදිග යුද ගැටුම් මෙරට ආර්ථිකයට ඇති කරන බලපෑම විමසන්න.

මැදපෙරදිග යුධ ගැටුම් ශ්‍රී ලංකා ආර්ථිකයට ඇති කරන බලපෑම

- තෙල් මිල ඉහළ යාම නිසා ආනයන වියදම් ඉහළ යාම
- මැද පෙරදිග රැකියා සඳහා පිටත්වන සංඛ්‍යාව පහළ වැටීම
- සේවා නියුක්ති ප්‍රේෂණ ගලා ඒම් අඩුවීම
- විනිමය අනුපාතය ක්ෂය වීම
- ජාතික ආරක්ෂාවට බලපෑම් ඇතිවීම
- පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනයක් හට ගැනීම
- සංචාරකයින්ගේ පැමිණීම පහළ වැටීම

(ඕනෑම කරුණු 5කට ල. 5)

PAST PAPERS WIKI



(37) WWW.PastPapers.WiKi (37)
Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!
CamScanner


PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න